සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය

சுகததாச தேசிய விளையாட்டுக் கட்டிடத்தொகுதி அதிகாரசபை

SUGATHADASA NATIONAL SPORTS COMPLEX AUTHORITY













# 2015

# වාර්ෂික වාර්තාව

# வருடாந்த அறிக்கை

# Annual Report

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය

# වාර්ෂික වාර්තාව
# 2015

# සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය


1. තොරතුරු සම්බන්ධීකරණය.................... 03
2. ක්‍රීඩාංගන පාලක කළමණාකාරීත්වය .................... 03
3. අපගේ දර්ශනය සහ මෙහෙවර.................... 04
4. සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය පිහිටුවීම.................... 05
5. ආයතනයේ සංවිධාන ව්‍යුහය.................... 06
6. අනුමත කාර්ය මණ්ඩලය.................... 07
7. අධිකාරියේ වගකීම් හා කාර්යයන්.................... 08
8. කළමනාකරණය .................... 09
9. පහසුකම් හා සේවා සපයනු ලබන ක්ෂේත්‍ර.................... 09
10. මානව සම්පත් සංවර්ධනය.................... 10
11. කළමනාකාරීත්ව වාර්තාකරණය .................... 11
12. වාර්ෂික ප්‍රසම්පාදනය.................... 14
13. සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනය.................... 15
    I. ගෘහස්ථ ක්‍රීඩාගාරය.................... 16
    II. උප ක්‍රීඩාගාරය.................... 18
    III. පිහිනුම් තටාක සංකීර්ණය.................... 19
    IV. කායවර්ධන මධ්‍යස්ථානය.................... 21
    V. ක්‍රීඩා හෝටලය .................... 21
14. ගෘහස්ථ ක්‍රීඩාංගනය ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය .................... 22
15. එළිමහන් ක්‍රීඩාංගනය.................... 23
16. එළිමහන් ක්‍රීඩාංගනය ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය .................... 25
17. ආර් ප්‍රේමදාස ක්‍රිකට් ක්‍රීඩාංගනය.................... 26
18. බෝගම්බර එළිමහන් ක්‍රීඩාංගනය.................... 27
19. බෙලිඅත්ත හා වීරකැටිය පිහිනුම් තටාක.................... 29
20. නුවරඑළිය තුරඟ තරඟ පිටිය.................... 30
21. ආයතනයේ සමස්ථ ප්‍රගතිය.................... 31
22. ගිණුම්කරණ ප්‍රතිපත්ති.................... 32
23. ආදායම් වියදම් ප්‍රකාශය.................... 37
24. ශේෂ පත්‍රය.................... 38
25. අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය.................... 39
26. විගණකාධිපති වාර්තාව හා යාවත්කාලීන තොරතුරු .................... 40

# තොරතුරු සම්බන්ධීකරණය

## ආයතනයේ නම * සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය ප්‍රතිස්ථාපනය කිරීම නීතිමය වශයෙන් 1999 අංක 17 දරන පාර්ලිමේන්තු පනත මගින් නීතිගත කර ඇත.

### කළමනාකාරීත්ව මණ්ඩලය (2015/03 - 2015/10)

විජේරත්න දේවගෙදර මහතා - සභාපති
ශාන්ත වීරසිංහ මහතා - සාමාජික
එස් ඩබ් මදනායක මහතා - සාමාජික
කේ ඩී එස් රුවන්චන්ද්‍ර මහතා - සාමාජික
(අධ්‍යක්ෂ ජෙනරාල්, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව)
කල්‍යානි සතරසිංහ මහත්මිය - සාමාජික
පත්මා ද සිල්වා මහත්මිය - සාමාජික
එස් එස් ඒ එස් දෙනියායගේ මහතා - සාමාජික
ධම්මිකා හේරත් මහත්මිය - සාමාජික
නුවන් විජේසිංහ මහතා - සාමාජික
ටෙරෝන් කෝන්න මහතා - සාමාජික
ටී ඩබ් ඩී ධර්මසිරි මහතා - සාමාජික

### කළමනාකාරීත්ව මණ්ඩලය (2015/11 සිට)

බ්‍රිගේඩියර් ජේ එම් එස් එස් ජයසුන්දර - සභාපති
සමන් බණ්ඩාර මහතා - සාමාජික
එස් ඩබ් මදනායක මහතා - සාමාජික
කේ ඩී එස් රුවන්චන්ද්‍ර මහතා - සාමාජික
(අධ්‍යක්ෂ ජෙනරාල්, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව)
කේ ඒ ආලෝක ශ්‍රීකාන්ත මහතා - සාමාජික
අයි ආර් යූ මහේෂ් විජේරත්න මහතා - සාමාජික
ඩබ් ටී බී කාබ්‍රාල් මහතා - සාමාජික
සුනිල් ගුණවර්ධන මහතා - සාමාජික
සම්පත් දිසානායක මහතා - සාමාජික
එච් එල් එම් එච් බණ්ඩාර මහතා - සාමාජික
ඒ එම් රකීබ් මහතා - සාමාජික

### බැංකුව

ලංකා බැංකුව - ග්‍රෑන්ඩ්පාස් ශාඛාව

### විගණනය

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
අංක 306/72, පොල්දූව පාර,
බත්තරමුල්ල.

### ලිපිනය

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය,
තැ.පෙ. 2211, ආතර් ද සිල්වා මාවත,
කොළඹ 13.

දුරකථන : 011-2445677, 2422841
011-2384490, 2384385
ෆැක්ස් : 011-2445675
විද්‍යුත් තැපැල : sugathad@sltnet.lk

### ක්‍රීඩා සංකීර්ණ පාලක මණ්ඩලය

විජේරත්න දේවගෙදර මහතා (2015 ඔක්තෝබර් දක්වා) - සභාපති
බ්‍රිගේඩියර් ජේඑම්එස්එස් ජයසුන්දර (2015 ඔක්තෝබර් සිට)
එස්එස්කේ ගුණවර්ධන මහතා - අධ්‍යක්ෂ
චමින්ද කේ උඩුකුඹුර මහතා - සහකාර අධ්‍යක්ෂ (පාලන)
සී.එච්.ජේ. රූපසිංහ මහතා - සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය)
ඩබ්එම්වයිජී විජේසූරිය මෙනවිය- සහකාර අධ්‍යක්ෂ (ක්‍රීඩා)

### සම්පාදනය

අධීක්ෂණය :
එස්එස්කේ ගුණවර්ධන (අධ්‍යක්ෂ)
සී අනුරාධ විදානගමාච්චි (සහකාර අධ්‍යක්ෂ - පාලන)
එච් අනෝජා ප්‍රියදර්ශනී (පරිපාලන නිළධාරී)

පරිඝණක යතුරු ලියනය :
අජිත් ඉන්දික සෙනවිරත්න (කළමනාකරණ සහකාර)
එම් තිළිණ සගිරංග මුතුනායක (කළමනාකරණ සහකාර)

භාෂා පරිවර්තනය (දෙමළ,ඉංග්‍රීසි) :
එම් නුස්රාත් මහතා (රජයේ භාෂා පරිවර්තක)

මුද්‍රණය : සැලැසිනෙ රූපවාහිනී ආයතනය

# අපගේ දර්ශනය සහ මෙහෙවර



## දර්ශනය

ආසියාවේ පළමු පෙළේ ජාත්‍යන්තර මට්ටමේ
ක්‍රීඩා පහසුකම් සහිත ක්‍රීඩා සංකීර්ණයක් බවට
සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය පත්කිරීම
සහ
එය සතු අනෙකුත් ක්‍රීඩා සංකීර්ණ දියුණු කිරීම
තුළින්
ශ්‍රී ලංකාවේ ක්‍රීඩා සංවර්ධනයට පහසුකම්
සහනදායීව ලබාදීම.

## මෙහෙවර

ජාත්‍යන්තර මට්ටමේ පහසුකම් සැපයීම
මගින්
ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ දියුණුවට දායකවීම
සහ
ශ්‍රී ලාංකික ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කුසලතා ඔප් නැංවීමට
අවැසි පහසුකම් සහිත ප්‍රමුඛතම
ජාත්‍යන්තර සංකීර්ණයක් බවට පත්වීම.

# සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය පිහිටුවීම



සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය භාරකාර අරමුදලක් ලෙස 1995.02.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ක්‍රීඩා අමාත්‍යාංශයට පවරා ගනු ලැබූ අතර, 1999 අප්‍රේල් මස 20 වන දින සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියක් බවට පත්කිරීමේ 1999 අංක 17 දරන පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදි. එකී පනත 1999.09.01 දින සිට බලපාන සේ සම්මත වූ අතර, එදින සිට මෙම ජාතික ක්‍රීඩා සංකීර්ණය, සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය ලෙස ස්ථාපිත කරන ලදි.

මෙම අධිකාරියේ කළමනාකරණ කටයුතු ක්‍රීඩා විෂය භාර අමාත්‍යවරයා විසින් පත්කරන කළමනාකාරීත්ව මණ්ඩලයක් මඟින් සිදුකරන අතර, එම මණ්ඩලය පහත සඳහන් පරිදි වේ.

1. සභාපති - ක්‍රීඩා විෂයභාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබේ.
2. ක්‍රීඩා විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ නියෝජිතයෙකු.
3. ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනත යටතේ පත්කරනු ලැබෙන ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්.
4. භාණ්ඩාගාරයේ නියෝජිතවරයෙකු.
5. මීට අමතරව, ක්‍රීඩා විෂය භාර අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබෙන සාමාජිකයින් 07 දෙනෙකු.

# ආයතනයේ සංවධාන ව්‍යුහය



# අනුමත කාර්ය මණ්ඩලය

කළමනාකාරිත්ව මණ්ඩල සාමාජිකයින්ට අමතරව ආයතනයේ අනුමත බඳවාගැනීමේ පටිපාටියේ පරිදි සේවයේ නියුතු ස්ථිර මුළු සේවක සංඛ්‍යාව 314ක් වේ. 2015-12-31 දිනට එම අනුමත සේවක සංඛ්‍යාවෙන් ආයතනයේ සේවය කළ සංඛ්‍යාව 93%ක් වේ. එය පහත සඳහන් පරිදි සවිස්තරාත්මකව දැක්විය හැක.

| අංක | තනතුර | වැටුප් කාණ්ඩය | අනුමත ස්ථිර සේවක සංඛ්‍යාව | කොන්ත්‍රාත් පදනම මත අනුමත සේවක සංඛ්‍යාව | 2015.12.31 දිනට සේවක සංඛ්‍යාව | 2015.12.31 දිනට කොන්ත්‍රාත් පදනම මත සේවක සංඛ්‍යාව | පුරප්පාඩු අතිරික්තය සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| 1 | සභාපති | | 1 | 0 | 1 | 0 | 0 |
| 2 | අධ්‍යක්ෂ | HM 1-1 | 1 | 0 | 1 | 0 | 0 |
| | **මධ්‍යම මට්ටමේ කළමනාකරු** | | | | | | |
| 3 | නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (පාලන) | MM 1-3 | 1 | 0 | 1 | 0 | 0 |
| 4 | නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) | | 1 | 0 | 1 | 0 | 0 |
| 5 | නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (ක්‍රීඩා) | | 1 | 0 | 1 | 0 | 0 |
| 6 | නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (තාක්ෂණික) | | 1 | 0 | 1 | 0 | 0 |
| 7 | නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ | | 1 | 0 | 0 | 0 | 1 |
| | **කණිෂ්ඨ කළමනාකරු** | | | | | | |
| 8 | සභාපතිතුමාගේ පෞද්ගලික ලේකම් | JM 1-1 | 0 | 1 | 1 | 0 | 0 |
| 9 | අභ්‍යන්තර විගණක | | 1 | 0 | 1 | 0 | 0 |
| 10 | තොරතුරු තාක්ෂණ නිළධාරී | | 1 | 0 | 1 | 0 | 0 |
| 11 | නඩත්තු නිළධාරී | | 1 | 0 | 0 | 0 | 1 |
| 12 | මිළදී ගැනීමේ නිළධාරී/ අලෙවි නිළධාරී | | 1 | 0 | 1 | 0 | 0 |
| 13 | ආරක්ෂක කළමනාකරු | | 1 | 0 | 1 | 0 | 0 |
| 14 | ක්‍රීඩාංගන කළමනාකරු (ගෘහස්ථ) | | 1 | 0 | 1 | 0 | 0 |
| 15 | ක්‍රීඩාංගන කළමනාකරු (එළිමහන්) | | 1 | 0 | 1 | 0 | 0 |
| 16 | ක්‍රීඩාංගන කළමනාකරු (බෝගම්බර) | | 1 | 0 | 0 | 0 | 1 |
| 17 | ක්‍රීඩාංගන කළමනාකරු (බෙලිඅත්ත) | | 1 | 0 | 1 | 0 | 0 |
| | **කළමනාකරණ සහකාර (තාක්ෂණික)** | | | | | | |
| 18 | තාක්ෂණික සහකාර (සිවිල්) | MA 2-1 | 1 | 0 | 0 | 0 | 1 |
| 19 | තාක්ෂණික සහකාර (විදුලි) | | 1 | 0 | 1 | 0 | 0 |
| 20 | ගබඩා භාරකරු | | 1 | 0 | 0 | 0 | 1 |
| 21 | පොත් තබන්නා | | 1 | 0 | 1 | 0 | 0 |
| | **කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)** | | | | | | |
| 22 | කළමනාකරණ සහකාර | MA 1-1 | 31 | 0 | 30 | 0 | 1 |
| 23 | භූමි පාලක | | 1 | 0 | 1 | 0 | 0 |
| 24 | වැඩ පරීක්ෂක | | 2 | 0 | 2 | 0 | 0 |
| 25 | ක්‍රීඩා නිළධාරී | | 8 | 0 | 8 | 0 | 0 |
| 26 | ක්‍රීඩා පුහුණුකරු* | | 1 | 0 | 1 | 0 | 0 |
| 27 | ප්‍රධාන ආරක්ෂක නිළධාරී | | 3 | 0 | 3 | 0 | 0 |
| 28 | ආරක්ෂක නිළධාරී | | 17 | 0 | 17 | 0 | 0 |
| 29 | කළමනාකරණ සහකාර (ස්ථාන භාර නිළධාරී) නුවරඑළිය | | 1 | 0 | 0 | 0 | 1 |
| 30 | ආරක්ෂක නිලධාරී (පාලක) නුවරඑළිය | | 1 | 0 | 0 | 0 | 1 |
| | **ප්‍රාථමික ශිල්පීන්** | | | | | | |
| 31 | විදුලි කාර්මික* | PL 3 | 0 | 0 | 1 | 0 | 1 |
| 32 | රියදුරු | | 6 | 0 | 6 | 0 | 0 |
| | **ප්‍රාථමික අර්ධ ශිල්පීන්** | | | | | | |
| 33 | වඩු කාර්මික | PL 2 | 3 | 0 | 3 | 0 | 0 |
| 34 | පෙදරේරු | | 3 | 0 | 3 | 0 | 0 |
| 35 | වැද්දුම්කරු | | 3 | 0 | 3 | 0 | 0 |
| 36 | පින්තාරු | | 3 | 0 | 2 | 0 | 1 |
| 37 | පැස්සුම්කරු | | 3 | 0 | 3 | 0 | 0 |
| 38 | බයිසිකල් පණිවිඩකරු | | 2 | 0 | 2 | 0 | 0 |
| | **ප්‍රාථමික අර්ධ ශිල්පීන් නොවන** | | | | | | |
| 39 | ක්‍රීඩාංගන සහායක | PL 1 | 110 | 0 | 106 | 0 | 4 |
| 40 | ආරක්ෂක නියාමක | | 100 | 0 | 98 | 0 | 2 |
| 41 | කාර්යාල කාර්ය සහායක | | 10 | 0 | 10 | 0 | 0 |
| 42 | ක්‍රීඩාංගන සහායක (නුවරඑළිය) | | 1 | 0 | 0 | 0 | 1 |
| 43 | ආරක්ෂක නිළධාරී (නුවරඑළිය) | | 8 | 0 | 0 | 0 | 8 |
| | | **එකතුව** | **336** | **1** | **314** | **0** | **24** |

# අධිකාරියේ වගකීම් හා කාර්යයන්

## වගකීම්

1. කළමනාකරණය කිරීම, නඩත්තු කිරීම සහ ජාතික වත්කමක් ලෙස සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය ආරක්ෂා කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

2. සියලු පහසුකම් සහ සේවා නඩත්තු කරගෙන යාම.

3. ගොඩනැගිලිවලට හා ව්‍යුහවලට අවශ්‍යවන වැඩිදියුණු කිරීම් හෝ වෙනස්කිරීම් සිදු කිරීම.

4. ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට හා විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන්ට ක්‍රීඩාවෙහි ස්වකීය හැකියාව වැඩි දියුණු කරගැනීම සහ ඔවුන්ගේ කායවර්ධන හා සෞඛ්‍යය වැඩිදියුණු කරගැනීමට හැකිවන සේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පනවනු ලබන කොන්දේසිවලට යටත්ව පහසුකම් ඔවුනට ලබාදීම.

5. විශේෂයෙන්ම ග්‍රාමීය අංශවල ක්‍රීඩා වැඩි දියුණු කිරීමේ අරමුණ ඇතිව ක්‍රීඩා පිළිබඳ පුහුණු පාඨමාලා සහ වැඩසටහන් පවත්වා ගෙනයාම.

6. ජාතික හා අන්තර්ජාතික උත්සව සඳහා අවශ්‍ය පහසුකම් කළමනාකාරීත්ව මණ්ඩලය විසින් පනවනු ලබන කොන්දේසිවලට යටත්ව ලබාදීම.

7. ශ්‍රී ලංකාවේ ක්‍රීඩා සහ විනෝදාත්මක පහසුකම් වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව, ජාත්‍යන්තර සහ දේශීය ක්‍රීඩා පුහුණු සංවිධානය, ක්‍රීඩා ආයතන සමග සම්බන්ධීකරණය සහ සම්බන්ධතා ඇති කරගැනීම.

8. අප අධිකාරියේ පහසුකම් කළමනාකාරීත්ව මණ්ඩලය විසින් පනවනු ලබන කොන්දේසිවලට යටත්ව සාධාරණ ගාස්තුවකට පාසැල්වලට, තරුණ ක්‍රීඩා සමාජවලට සහ ක්‍රීඩා සංවිධානවලට සැපයීම.

## කාර්යයන්

1. ඉහත වගකීම් ඉටුකරනු වස් අප අධිකාරිය විසින් පහත ක්‍රියාමාර්ග ගනු ලබන අතර, ජාතික ක්‍රීඩා සංගම්, පාසල් ක්‍රීඩා සංගම් හා රාජ්‍ය මෙන්ම පෞද්ගලික ආයතන සඳහා කළමනාකාරීත්ව මණ්ඩලය මගින් අනුමත කළ සහනදායි ගාස්තු යටතේ සේවා හා පහසුකම් සපයනු ලැබේ.

2. ජාතික හා ජාත්‍යන්තර ජවන හා පිටිය ක්‍රීඩා තරඟ සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන් පුහුණු කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම.

3. ජාත්‍යන්තර මට්ටමේ තරඟ දිවා කාලයේදී මෙන්ම රාත්‍රී කාලයේදී පැවැත්වීමට අවශ්‍ය පහසුකම් සැපයීම.

4. අඩු පහසුකම් සහිත පාසැල් හා ග්‍රාමීය මට්ටමේ දක්ෂතා සපිරි ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට අවශ්‍ය යටිතල පහසුකම් සපයාදීම මගින් ඔවුන්ගේ දක්ෂතා වැඩිදියුණු කරගෙන ඉදිරියට ඒමට අවශ්‍ය පහසුකම් සැපයීම.

5. ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ පිහිනුම් තරඟ පැවැත්වීමට අවශ්‍ය පිහිනුම් හා කිමිඳුම් තටාකාංගන පහසුකම් සැපයීම.

6. විභාග, සම්මන්ත්‍රණ, සමුළු හා උත්සව, විනෝද කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.

7. පුහුණු වැඩමුළු සංවිධානය කිරීම.

# පහසුකම් සහ සේවා සපයනු ලබන ක්ෂේත්‍ර

දිවා කාලයේ මෙන්ම රාත්‍රි කාලයේදී ද පහසුකම් සහ සේවා සැපයීමේ සුවිශේෂ හැකියාවන් සතු සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය ක්‍රීඩා, සෞඛ්‍ය, අධ්‍යාපන මෙන්ම විනෝදාස්වාද යන ක්ෂේත්‍ර සඳහා පහසුකම් සහ සේවා සැපයීමෙන් ජාතික වශයෙන් අති විශාල දායකත්වයක් දරයි. විශේෂයෙන්ම ක්‍රීඩා ක්ෂේත්‍රය සඳහා ජාත්‍යන්තර මට්ටමේ සේවා සහ පහසුකම් සැපයීමේ ප්‍රමුඛතම ආයතනය සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියයි.

## ක්‍රීඩා

මලල ක්‍රීඩා, රගර්, දැල්පන්දු, ක්‍රිකට්, පැසිපන්දු, ස්කොෂ්, අත්පන්දු, බැඩ්මින්ටන්, මේසපන්දු, ජුඩෝ, මල්ලවපොර, වුෂු, බොක්සිං, ටයිකොන්ඩෝ, කරාතේ, ජිම්නාස්ටික් යනාදී ක්‍රීඩා සඳහා ජාත්‍යන්තර මට්ටමේ පහසුකම් සැපයීම.

## සෞඛ්‍ය හා අධ්‍යාපනය

ජාතික හා ජාත්‍යන්තර උත්සව, වැඩමුළු, පුහුණු පාඨමාලා, පිහිනුම් හා ජීවිතාරක්ෂක පාඨමාලා, කායවර්ධන පාඨමාලා, සංදර්ශන, රැස්වීම් සඳහා ජාත්‍යන්තර මට්ටමේ සේවා සහ පහසුකම් සැපයීම.

## විනෝදාස්වාදය

ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ මහා පරිමාණ සංදර්ශන සඳහා සේවා හා පහසුකම් සැපයීම.

## වෙළෙඳ ප්‍රචාරණ හා දැන්වීම්

අලෙවිකරණයට අදාළ නිශ්චල ඡායාරූප ගැනීමට සහ වීඩියෝ පට සඳහා අවශ්‍ය පසුතල ලබාදීම මඟින් සේවා සහ පහසුකම් සැපයීම. අතිශයින් ජනප්‍රිය වෙළෙඳ දැන්වීම් සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය ආශ්‍රිතව රූගත කර ඇති බව සඳහන් කළයුතුව ඇත.

**ඉහත සේවා සහ පහසුකම් සැපයීම සඳහා සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය පහත සඳහන් ආයතනවලින් සමන්විත වේ.**

1. සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනය හා පිහිනුම් තටාක සංකීර්ණය
2. සුගතදාස ක්‍රීඩා හෝටලය
3. සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනය
4. ආර්.ප්‍රේමදාස ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය
   (2006-11-01 දින සිට වසර තිහක කාලයක් සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට බදු දී ඇත.)
5. බෝගම්බර එළිමහන් ක්‍රීඩාංගනය
6. බෙලිඅත්ත හා වීරකැටිය පිහිනුම් තටාක
7. නුවරඑළිය තුරඟ තරඟ පිටිය

# මානව සම්පත් සංවර්ධනය

2015 මූල්‍ය වර්ෂය තුළ සේවක අභිප්‍රේරණය සහ කුසලතා වර්ධනය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලද වර්ෂයකි. එම වර්ෂය තුළ පහත සඳහන් විෂය ක්ෂේත්‍රයන්ට අනුකූලව පුහුණු පාඨමාලා සහ වැඩසටහන් ලබාදීමට ඉහළ පාලනාධිකාරිය කටයුතු කර ඇත.

| අ.අ. | පාඨමාලාව | කාලසීමාව | සහභාගීත්වය | මුදල (රු.) |
|---|---|---|---|---|
| 01 | Workshop attitudes and skills development | 2015/02/27 | 03 | 10,500.00 |
| 02 | Olympic solidarity sports administration course | 2015/04/20 - 23 | 02 | 6,000.00 |
| 03 | වතුර පොම්ප සහ වායු පීඩන යන්ත්‍ර නඩත්තු. | 2015/05/13 - 17 | 05 | 55,500.00 |
| 04 | රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන්ම රජය සතු සමාගම්වල වැටුප් ගෙවීම. | 2015/09/16 - 17 | 01 | 8,500.00 |
| 05 | චිත්‍රකරණ සැලසුම් පාඨමාලාව. | 2015/10/02 (පැය 50) | 03 | 36,000.00 |
| 06 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සහ වත්කම් අපහරණය. | 2015/12/08 - 09 | 01 | 8,500.00 |
| 07 | කාර්යාල කළමනාකරණය. | 2015/12/01 - 02 | 04 | 24,000.00 |
| 08 | ඵලදායිතා වැඩි දියුණු කිරීම. | 2015/12/02 - 04 | 01 | 8,000.00 |
| මුළු මුදල | | | | 157,000.00 |

# 2015 වර්ෂය සඳහා සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ විගණන කාර්යය

2015 විගණිත වර්ෂය සඳහා විගණන විමසුම් 20ක ප්‍රමාණයක් ඉදිරිපත් වී ඇති අතර, එයින් විමසුම් 16ක් සඳහා පිළිතුරු සැකසීමට අධිකාරිය කටයුතු කර ඇත.

01. විගණන කමිටුව එම වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 04ක් පැවැත්වීමට කටයුතු කර ඇත. ඒ අනුව, මෙම අධිකාරිය විසින් 2015 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 04ක් පවත්වා ඇත.

02. 2015 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන වාර්තා ගණන 26කි.

03. අභ්‍යන්තර විගණන විමසුම් සඳහා 2015 වර්ෂයට අදාල පිළිතුරු ලබා දී ඇති අතර, ඒවා ක්‍රියාවටද ලක්කර ඇත.

04. ක්‍රීඩා අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 04ක් සඳහා සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ ඊට අදාල නිළධාරීන් සහභාගි වී ඇත.

# 2015 වර්ෂයට අදාල කළමනාකාරීත්ව රැස්වීම් සහ ලබාගත් තීරණ

මෙම අධිකාරියේ අභිවෘද්ධියට අදාල තින්දු තිරණ ගැනීම කළමනාකාරීත්ව මණ්ඩලය විසින් සිදුකරන අතර ඊට අදාල රැස්වීම් මාසිකව පැවැත්වේ. 2015 වර්ෂයට අදාලව කළමනාකාරීත්ව මණ්ඩල රැස්වීම් 10ක් පවත්වා ඇති අතර එම රැස්වීම්වලදී ලබාගත් වැදගත් තිරණ පහත පරිදි ඉදිරිපත් කර ඇත.

| අ.අ. | දිනය | කාරණය | ලබාගත් තිරණය |
|---|---|---|---|
| 1. | 2015/03/16 | සුගතදස ක්‍රිඩා හෝටලයේ ආපනශාලාව මාසික කුලි පදනම මත තාවකාලිකව ලබාදීම. | දැනට සුගතදස ක්‍රිඩා හෝටලයේ මුළුතැන්ගෙය හා ආපනශාලාව දිගු කාලයක සිට භාවිතා නොකරන බැවින් නියමිත ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් සුගතදස ක්‍රිඩා හෝටලය කුලියට ලබාදෙන තෙක්, ජේඩීස් රෙස්ටොරන්ට් ඇන්ඩ් ටේක් අවේ (JD'S RESTAURANT & TAKE AWAY) ආයතනයට මාසික කුලි පදනම මත තාවකාලිකව ලබාදීමට කටයුතු කරන ලදි.<br><br>එම ආයතනයට රු 40,000/- (බදු රහිත) මාසික කුලියකට මුළුතැන්ගෙය, ගබඩා කාමර හා ආපනශාලාව මාස තුනක (03) කාලයකට ලබාදීමට ආවරණ අනුමැතිය ලබාදෙන ලදි. |
| 2. | | දින සියයේ (100) වැඩසටහන යටතේ ක්‍රියාත්මක කිරිමට සැළසුම් කර ඇති ව්‍යාපෘතින්. | ගරු ක්‍රිඩා අමාත්‍යතුමාගේ උපදෙස් හා මඟපෙන්වීම මත දින සියයේ (100) වැඩසටහන යටතේ ක්‍රියාත්මක කිරිමට හා ප්‍රමුඛතාවය ලබාදීමට සැළසුම් කර ඇති ව්‍යාපෘතින් කළමනාකාරීත්ව මණ්ඩලයේ දැන ගැනිම සඳහා ඉදිරිපත් කර තිබූ අතර, ඒ පිළිබඳ සාකච්ජා කිරීමෙන් අනතුරුව එම ව්‍යාපෘති දින සියය (100) ඇතුළත ආරම්භ කිරීම සඳහා කඩිනම් පියවර ගන්නා ලෙස දැනුම් දෙන ලදි. අදල ව්‍යාපෘතින්හි වැඩ කටයුතු ඉටුකිරීම සඳහා කළමනාකාරීත්ව මණ්ඩල අනුමැතිය දෙන ලදි. |
| 3. | | ප්‍රායෝගික පුහුණුව සඳහා අභ්‍යාසලාභින් රාජ්‍ය ආයතනවලට අනුයුක්ත කිරිම | තෘතියික හා උසස් අධ්‍යාපන ආයතනයන්හි පාඨමාලා සාර්ථක අන්දමින් නිමකර ඇති අභ්‍යාසලාභින් සුගතදස ජාතික ක්‍රිඩා සංකීර්ණ අධිකාරියට අනුයුක්තව ඔවුන්ගේ ප්‍රායෝගික පුහුණු කටයුතු සිදුකිරීමට ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බැවින් ආයතනයේ අවශ්‍යතාවය මත පරිගණක, ගිණුම් හා පරිපාලන අංශවල ප්‍රායෝගික පුහුණුව සඳහා අභ්‍යාසලාභින් දසදෙනෙකු (10) අප අධිකාරියට 2012-01-20 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2000(iv) අනුකුල කර, අනුයුක්ත කර ගැනිම සඳහා කළමනාකාරීත්ව මණ්ඩලයේ අනුමැතිය ලබාදෙන ලදි. |
| 4. | | පත්වීම් ලිපියට අනුව වසර 05කට වඩා වැඩි කාලයක් තනතුරට අදාල නොවන සේවා ස්ථානවල සේවය කර ඇති සේවක සේවිකාවන් දැනට සේවය කරනු ලබන තනතුරු වල ස්ථිර කිරීම. | ආයතනයේ සේවය සඳහා බඳවා ගන්නා ලද විවිධ තනතුරු වලට අයත් සේවක සේවිකාවන් 54 දෙනෙකු තම පත්වීම් ලිපියට අදල තනතුරේ නොව වෙනත් තනතුරකට අනුයුක්තව සේවය කරන බව නිරීක්ෂණය වූ බව සභාපතිතුමා විසින් කළමනාකාරීත්ව මණ්ඩලය වෙත දන්වා සිටින ලදි. මෙම සේවක සේවිකාවන්ගේ සුදුසුකම් සලකා බලා එම තනතුරුවලම ස්ථිර කිරීමට කටයුතු කළයුතු බවද දන්වා සිටින ලදි. |
| 5. | | ඉවත්කළ ක්‍රිඩා භාණ්ඩ දුෂ්කර පාසල්වලට ලබාදීම හා ජල ටැංකි ජල හිඟයෙන් පිඩා විඳින ගම්මාන වෙත ලබාදීම. | භාවිතයට ගත නොහැකි ක්‍රිඩා භාණ්ඩ රැසක් සුගතදස එළිමහන් හා ගෘහස්ථ ක්‍රිඩාංගණවල ගබඩා කර ඇති බව නිරීක්ෂණයවූ සභාපතිතුමා විසින් දන්වා සිටින ලද අතර, එම ඉවත් කරන ලද භාණ්ඩ දුෂ්කර පාසල්වලට ලබාදීමට හා ජල ටැංකි ජල හිඟයෙන් පිඩා විඳින ගම්මානවල ජනතාවගේ ප්‍රයෝජනයට ලබාදීමට සුදුසු බවත් සඳහන් කරන ලද අතර එම භාණ්ඩ නිසි ක්‍රමවේදයන් අනුගමනය කරමින් අවශ්‍යතාවය හඳුනාගැනීමෙන් අනතුරුව දුෂ්කර පාසල් වලට හා ජලයෙන් පිඩා විඳින ගම්මානවලට ලබාදීමට කළමනාකාරීත්වයේ අනුමැතිය දෙන ලදි. |
| 6. | | මීටර් 400 ධාවන පථය නැවත ඇතිරීම | සුගතදස එළිමහන් ක්‍රිඩාංගණයේ මීටර් 400 ධාවන පථය නැවත ඇතිරීම සඳහා සුදුසු කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනිමට ලේකම්, ක්‍රිඩා අමාත්‍යාංශය වෙත පැවරීම සුදුසු බවටත් මීටර් 400 ධාවන පථය නැවත අතුරන අවස්ථාවේදි එම කාර්යයන් නිරීක්ෂණයට හා උපදේශක සේවාව දේශීයව මෙන්ම ජාත්‍යන්තර මළල ක්‍රිඩා සංගමයේ අනුමත |

| | | | |
|---|---|---|---|
| | | | උපදේශාත්මක ආයතනයකින් සේවාව ලබාගැනීම සුදුසු බවටත් තිරණය විය. |
| 7. | | නුවරඑළිය දිස්ත්‍රික්කයේ තෝරාගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 500 දෙනෙකුට තුන් දින ක්‍රීඩා පුහුණුවක් ලබාදීම. | සුගතදස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ පනතට අනුව ග්‍රාමීය ප්‍රදේශවල ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට අවශ්‍ය යටිතල පහසුකම් ලබාදී ක්‍රීඩාව දියුණු කිරීම අප ආයතනය සතු වගකීම හා කාර්යය වේ. මෙම කරුණ මූලික කරගෙන ප්‍රථම වතාවට නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 500 දෙනෙකුට තුන් දින ක්‍රීඩා පුහුණුවක් ලබාදීමට අනුමැතිය ලබාදෙන ලදී. |
| 8. | 2015/03/27 | සුගතදස ගෘහස්ථ / එළිමහන් ක්‍රීඩාංගණවලට බාහිර ආයතන වලින් රැගෙන එන සැරසිලි හා ඉවතලන ද්‍රව්‍ය නැවත රැගෙන නොයාම සම්බන්ධව. | සුගතදස ගෘහස්ථ හා එළිමහන් ක්‍රීඩාංගණ පරිහරණය කරනු ලබන සේවාදයකයින් / ආයතන විසින් රැගෙන එන සැරසිලි හා ඉවතලන ද්‍රව්‍ය නැවත රැගෙන නොයාම මහත් ගැටළුවක් බවට පත්ව ඇති බව දන්වා ඇති අතර, එම කැළි කසළ ඉවත් කිරීම සඳහා කොළඹ මහ නගර සභාව වෙත අමතර මුදලක්ද ගෙවීමට සිදුව ඇති බවද දන්වා ඇත. එබැවින් මේ සඳහා ක්‍රමවේදයක් හඳුන්වා දීම සුදුසු බව තිරණය කරන ලද අතර, මෙම ඉවතලන ද්‍රව්‍ය නැවත රැගෙන නොයන සේවාදයකයින් / ආයතනයන් කරනු ලැබූ ඉසව් අනුව වර්ගීකරණය කර මුදලක් අය කිරීම. |
| 9. | 2015/08/28 | විද්‍යුත් කාලගණක පද්ධති මිළදී ගැනීම - සුගතදස එළිමහන් ක්‍රීඩාංගණයට හා පිහිනුම් තටාක පරිහරණය සඳහා | සුගතදස එළිමහන් ක්‍රීඩාංගණයේ හා පිහිනුම් තටාකයේ කාල ගණනය සඳහා භාවිතා කරනු ලබන උපකරණ මිළදී ගෙන ඇත්තේ මීට වසර 10කට පමණ පෙර බැවින් එම උපකරණ අළුත්වැඩියා කරමින් අවශ්‍ය සේවාව සැපයීම සඳහා යොදවා ගනු ලබයි" දැනට පවතින තාක්ෂණයට ගැලපෙන අයුරින් ජාත්‍යන්තර පහසුකම් සපයන ක්‍රීඩාංගණයකට සුදුසු හා ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ අවශ්‍යතා සම්පූර්ණ කිරීමට හැකි අයුරින් නවතම උපකරණ මිළදී ගැනීම සුදුසු බව යෝජනා විය. |
| 10. | | මීටර් 200 ධාවන පථය පරිශ්‍රය තුළ ඇති වැසිකිළි පද්ධතිය. | සුගතදස එළිමහන් ක්‍රීඩාංගණයේ මීටර් 200 ධාවන පථය පරිශ්‍රය තුළ ඇති වැසිකිළි පද්ධතිය එම ස්ථානයට නුසුදුසු බව නිරීක්ෂණය වී ඇති බැවින්, වැසිකිළි පද්ධතිය වෙනත් ස්ථානයක ස්ථාපිත කිරීමටත්, එම ස්ථානයේ ක්‍රීඩා උපකරණ ගබඩා කිරීම සඳහා යොදා ගැනීමටත් යෝජනා කර සිටින ලද අතර, එම යෝජනාව කළමනාකාරිත්ව මණ්ඩලය විසින් අනුමත කරන ලදී. |
| 11. | | සුගතදස එළිමහන් ක්‍රීඩාංගණයේ කම්කරු විවේකාගාරයක් ඉදිකිරීම | සුගතදස එළිමහන් ක්‍රීඩාංගණයේ සේවය කරන කම්කරුවන් සඳහා විවේකාගාරයක් හා ඇඳුම් මාරුකිරීමේ ස්ථානයක් නොමැති බැවින් ඔවුන්ගේ පහසුව පිණිස විවේකාගාරයක් ඉදිකිරීම අවශ්‍ය බව සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී. කම්කරුවන් විසින් දැනට භාවිතා කරනු ලබන ස්ථානය කිසිදු පහසුකමක් නොමැති ස්ථානයක් බැවින් අවශ්‍ය පහසුකම් සහිතව විවේකාගාරයක් ඉදි කිරීම සේවක සුභ සාධනය ඉහළ මට්ටමකට රැගෙන ඒමට රුකුලක් වන නිසා, මේ සම්බන්ධව සාකච්ඡා කිරීමෙන් අනතුරුව විවේකාගාරය ඉදි කිරීම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීමට කළමනාකාරිත්ව මණ්ඩල අනුමැතිය දෙන ලදී. |
| 12. | | සියළු ආරක්ෂක කුටි නවීකරණය කිරීම | ආයතනයේ සියළු ආරක්ෂක කුටි ඉතා අබලන් සහ අඩු පහසුකම් යටතේ පවතින බැවින් වත්මනට ගැලපෙන සේ නවීකරණය කිරීම සුදුසු බව යෝජනාවූ අතර, අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකිරීම සඳහා කළමනාකාරීත්ව මණ්ඩල අනුමැතිය දෙන ලදී. |
| 13. | 2015/05/26 | ගාස්තු සංශෝධනය කිරීම - බෝගම්බර ක්‍රීඩාංගණයේ රථ ගාල | ගාස්තු අය කිරීමේ පදනම මත බෝගම්බර ක්‍රීඩාංගණයේ රථ ගාල මහජනතාව සඳහා විවෘත පවතින අතර, එමඟින් විශාල සංඛ්‍යාවක් පහසුකම් ලබා ගැනීම සිදුකරයි. මීට වසර 04කට පමණ පෙර මෙහි ගාස්තු වැඩිකර ඇති අතර, මෙම ගාස්තු සංශෝධනය කළයුතු බව නිරීක්ෂණය වී ඇති බැවින්, රථ ගාලේ ගාස්තු සංශෝධනය කිරීමට අනුමැතිය ලබාදෙන ලදී. |
| 14. | 2015/06/30 | ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් සැළසුම් හා ඉදිකිරීමට යෝජිත ගෘහස්ථ දැල (Indoor Net) සහ පිහිනුම් තටාක පහසුකම් (Swimming Pool Facility) සම්බන්ධව. | සුගතදස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය හා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය අතර අත්සන් කරන ලද ගිවිසුමට අනුව ඉහත සඳහන් කර ඇති ව්‍යාපෘතින්හි කටයුතු ඉදිරියට කරගෙන යාම සම්බන්ධව එකඟතාවයකට පැමිණ ඇති බැවින්, මේ පිළිබඳව වැඩිදුරටත් සාකච්ඡා කිරීමෙන් අනතුරුව එම ව්‍යාපෘතින්හි ඉදිරි කටයුතු සිදුකිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලදී. එමෙන්ම, අදාල ව්‍යාපෘතින්හි ව්‍යුහමය සැළසුම්පත (Structural Drawings) හා ඊට අදාල |

| | | | |
|---|---|---|---|
| | | | වන අනෙකුත් විස්තර (විදුලිය, ජලය හා අපවහන පද්ධතීන් ද ඇතුළත්ව) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන් ලබාගන්නා ලෙස සහකාර අධ්‍යක්ෂ (තාක්ෂණ) වෙත උපදෙස් දෙන ලදී. |
| 15. | 2015/07/21 | කණිෂ්ඨ කළමනාකාර සේවා ගණයේ (JM 1-1) බඳවා ගැනීම් පටිපාටිය අනුමත කිරීම සම්බන්ධව | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් යොමුකර ඇති DMS/1577 අංක දරණ 2014-12-10 දිනැති හා DMS/1577 අංක දරණ 2015-07-08 දිනැති ලිපි පිළිබඳව කළමනාකාරීත්ව මණ්ඩලයේ අවධානය යොමුකළ අතර, අදල තනතුරු සම්බන්ධව සිදුව ඇති සංශෝධනයන් සාකච්ඡා කිරීමෙන් අනතුරුව කළමනාකරන සේවා දෙපාර්තමේන්තුවෙන් ඉදිරිපත් කර ඇති උපදෙස් අනුව ඉදිරි කටයුතු සිදුකිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලදී. |
| 16. | | නුවරඑළිය නගර සභාව මඟින් භුක්ති විඳිනු ලබන ක්‍රීඩා අමාත්‍යාංශයට අයත් භූමිය පවරා ගැනීම | මෙම කරුණ සම්බන්ධව දීර්ඝ ලෙස සාකච්ඡා කරන ලද අතර, නුවරඑළිය තුරඟ තරඟ පිටිය ක්‍රීඩා අමාත්‍යාංශයට පැවරීමටත් පෙර සිට නුවරඑළිය නගර සභාව විසින් මෙම භූමිය විවිධ ක්‍රියාකාරකම් සඳහා ලබාදී ඇති බව දන්වා සිටින ලදී. එමනිසා ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම් මාර්ගයෙන් මෙම පවරා ගැනීම් හා ඉදිරි කටයුතු සිදුකිරීම සුදුසු බව කළමනාකාරීත්ව මණ්ඩලය දන්වා සිටින ලදී. |
| 17. | 2015/10/12 | දිරපත්වී ඇති නාම පුවරු | සුගතදාස එළිමහන් ක්‍රීඩාංගණයේ නගර සභාවට අයත් වසර 20 කට වඩා පැරණි නාම පුවරු තුනක් (03) භාවිතයට ගත නොහැකි අයුරින් අබලන්වී ඇති අතර එම නාම පුවරු පෞරාණික වුවත්, භාවිතයට ගත නොහැකි තත්වයෙන් තිබෙන බැවින් ඒවා එම ස්ථාන වලින් ඉවත් කිරීම සුදුසු බවත්, ඒ සම්බන්ධව කොළඹ මහ නගර සභාව දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසටත් කළමනාකාරීත්ව මණ්ඩලය තීරණය කළ අතර, ඒ සඳහා ඉදිරි කටයුතු සිදුකිරීමට අනුමැතිය දෙන ලදී. |
| 18. | | කායවර්ධන මධ්‍යස්ථානය සේවක මණ්ඩලය වෙත සහන පදනම මත භාවිතා කිරීමට අවස්ථාව ලබාදීම | සේවක මණ්ඩලය වෙත වසරකට රු 500/- ක (බදු රහිත) මුදලකට ගෘහස්ථ ක්‍රීඩාංගණයේ කායවර්ධන මධ්‍යස්ථානය පරිහරණය කිරීමට 2015-11-01 දින සිට කළමනාකාරීත්ව මණ්ඩලය අනුමැතිය දෙන ලදී. |
| 19. | 2015/12/01 | නුවරඑළිය තුරඟ තරඟ පිටියේ දෛනිකව දේශීය / විදේශීය සංචාරකයින් රැගෙන පැදවීම් කරනු ලබන සතුන් (පෝනින්) ලියාපදිංචි කිරීම | නුවරඑළිය තුරඟ තරඟ පිටියේ දේශීය / විදේශීය සංචාරකයින්ගේ විනෝදස්වාදය උදෙසා පෝනින් පැදවීම දෛනිකව සිදුකරනු ලබන අතර, එම පෝනින් අයිතිකරුවන්ගේ මාසිකව 10% සාමාජික ගාස්තුවක් අයකරනු ලබයි. මේ අයුරින් ගාස්තු අය කිරීම ගැටළු සහගත බැවින් පෝනි අයිතිකරුවන්හට සාමාජික ගාස්තුවක් නිකුත් කිරීමටත්, පෝනින් පැදවීමට හා මාසික ගාස්තුව ලෙස රු 1,000/- ක මුදලක් අයකිරීමටත් කළමනාකාරීත්ව මණ්ඩලය අනුමත කරන ලදී. |
| 20. | | 2016 වර්ෂය වෙනුවෙන් සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ සේවක මණ්ඩලය වෙත තිළිණයක් ලබාදීම | පෙර වර්ෂවලදී ලබාදුන් පරිදි 2016 වර්ෂය සඳහාත් අධිකාරියේ සේවක මණ්ඩල සාමාජිකයින් වෙත තිළිණයක් ලෙස ටී ෂර්ටයක් හා කැප් තොප්පියක් ලබාදීම කළමනාකාරීත්ව මණ්ඩල අනුමැති ලබාදෙන ලදී. |
| 21. | 2015/12/17 | කාර්යය මණ්ඩලය සඳහා ප්‍රසාද දීමනා ලබාදීම - 2015 | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කර ඇති 2015-12-09 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2015ට අනුව 2015 වර්ෂය සඳහා කාර්යය මණ්ඩලයට - එක් අයෙකුට රු2,000/- බැගින් ප්‍රසාද දීමනා ලබාදීමට කළමනාකාරීත්ව මණ්ඩලය අනුමත කර ඇත. |
| 22. | | සේවක මණ්ඩලය වැඩමුළු සඳහා සහභාගි කරවීම | සේවක මණ්ඩලයේ සියළුදෙනාගේම චිත්ත ධෛර්යය ඇතිකිරීමටත්, ආකල්පමය වෙනසක් ඇති කිරීමටත් සේවක මණ්ඩලයේ අයවළුන් කොටස් වශයෙන් වැඩමුළු සඳහා සහභාගි කරවීම සුදුසු බව කළමනාකාරීත්ව මණ්ඩලය විසින් සාකච්ඡා කරන ලද අතර, ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කිරීමටත්, සුදුසු වැඩමුළු සඳහා යොමුකිරීමටත් කළමනාකාරීත්ව මණ්ඩලයේ අනුමැතිය දෙන ලදී |

**භාණ්ඩ සමීක්ෂණය**

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ 2015 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණය 2015.12.12 දින අනු කමිටු 10 කින් සමන්විත භාණ්ඩ සමීක්ෂණ කමිටුව පත් කරන ලදී. රජයේ මුදල් රෙගුලාසි අනුව කටයුතු කෙරෙන මෙම භාණ්ඩ සමීක්ෂණයේ වාර්තාව සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) මඟින් අවසන් කොට ඇත.

# වාර්ෂික ප්‍රසම්පාදනය

2015 මුල්‍ය වර්ෂය තුළ අධිකාරියේ ක්‍රියාකාරකම් උදෙසා සිදුකරන ලද ප්‍රසම්පාදන ක්‍රියාවලිය පහත පරිදි වේ.

| අ.අ. | ප්‍රසම්පාදනය | මුදල (රු.) |
|---|---|---|
| 01 | ආරක්ෂක අංශය සඳහා වොව්මන් ක්ලොක් හා ඊට අදාල යතුරු 06ක් මිල දී ගැනීම. | 334,508.00 |
| 02 | ගෘහස්ථ ක්‍රීඩාංගනය සඳහා අභ්‍යන්තර දුරකථන පද්ධතියක් මිල දී ගෙන ස්ථාපිත කිරීම. | 2,968,865.00 |
| 03 | එළිමහන් ක්‍රීඩාංගනයට අයත් ආතර් ද සිල්වා මාවතට මුහුණලා පිහිටි කඩසාප්පු බදු දීම. | 56,000.00 |
| 04 | පරිගණක ජාලගත කිරීම සඳහා Computer Server එකක් මිල දී ගැනීම. | 452,273.30 |
| 05 | පරිගණක ජාල ආරක්ෂණ පද්ධතියක් ස්ථාපිත කරගැනීම. | 912,652.77 |
| 06 | ගෘහස්ථ, එළිමහන් ක්‍රීඩාංගන හා ක්‍රීඩා හෝටලය පිරිසිදු කිරීමේ සේවාව ලබා ගැනීම. | 7,086,240.00 |
| 07 | ගෘහස්ථ හා එළිමහන් ක්‍රීඩාංගන සඳහා තිර රෙදි මසා නිමකර ගැනීම. | 1,233,124,31 |
| 08 | එළිමහන් ක්‍රීඩාංගනයේ ඕ රථගාලෙහි වැසිකිළි පද්ධතිය මාසික කුළී පදනම මත බදු දීම. | 62,000.00 |
| 09 | අධිකාරියට අයත් ඕ රථගාල සහ බෝගම්බර රථගාල මාසික කුළී පදනම මත බදු දීම. | 1,000,000.00 |
| 10 | පිහිනුම් තටාකයේ භාවිතා කරන Lane Rope ගබඩා කර තැබීම සඳහා Steel Drump මිලදී ගැනීම. | 575,000.00 |
| 11 | බෝගම්බර ක්‍රීඩාංගනයේ ප්‍රේක්ෂකාගාරවල පුටු අළුත්වැඩියාව සහ අලුතින් සවි කිරීම. | 6,798,580.00 |
| 12 | ගෘහස්ථ හා එළිමහන් ක්‍රීඩාංගන සඳහා ඩිජිටල් ඇඩ්වර්ටයිසින් පුවරු සවිකිරීම. | 9,464,400.00 |
| 13 | බෝගම්බර ක්‍රීඩාංගනය සඳහා පිරිසිදු කිරීමේ සේවාව ලබා ගැනීම. | 100,000.00 |
| 14 | ගෘහස්ථ ක්‍රීඩාංගනයේ වහල අලුත්වැඩියාව. | 14,985,000.00 |
| 15 | එළිමහන් ක්‍රීඩාංගනයේ අලුත්වැඩියා, වැඩි දියුණුකිරීම් හා තීන්ත ආලේප කිරීම. | 9,016,500.00 |
| 16 | එළිමහන් ක්‍රීඩාංගනයට හා බෝගම්බර ක්‍රීඩාංගනයට අවශ්‍ය තණකොළ කපන යන්ත්‍ර මිලදී ගැනීම. | 1,000,000.00 |
| 17 | එළිමහන් ක්‍රීඩාංගනයේ වැසිකිළි අලුත්වැඩියාව. | 17,540,650.00 |
| 18 | ගෘහස්ථ ක්‍රීඩාංගනයේ VIP ආපන ශාලාවේ සහ VIP කාමරය සඳහා ලී බඩු මිලදී ගැනීම. | 4,057,600.00 |
| **මුළු මුදල** | | **77,643,393.38** |

# සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනය

සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනය පහත සඳහන් අංගවලින් සමන්විත වේ.

1. ගෘහස්ථ ක්‍රීඩාගාරය
2. උප ක්‍රීඩාගාර (බැඩ්මින්ටන්, ස්කොෂ් හා මේස පන්දු)
3. පිහිනුම් තටාක සංකීර්ණය
4. කායවර්ධන මධ්‍යස්ථානය
5. ක්‍රීඩා හෝටලය



# ගෘහස්ථ ක්‍රීඩාගාරය

ගෘහස්ථ ක්‍රීඩාගාරය ආසන 5004කින් සැදුම්ලත් වායුසමීකරණය කළ ප්‍රේක්ෂකාගාරයකින් සමන්විත වන අතර, මෙහි ගෘහස්ථ ක්‍රීඩා පිටියෙහි පළල මීටර් 35ක් හා දිග මීටර් 40ක් වේ. මෙම ක්‍රීඩාගාරයේ පැසිපන්දු, බැඩ්මින්ටන්, දැල්පන්දු, ජුඩෝ, ජිම්නාස්ටික්, වොලිබෝල්, මේස පන්දු, බොක්සිං, කරාතේ, මල්ලවපොර ආදී ගෘහස්ථ ක්‍රීඩා තරග පැවැත්වීමට පහසුකම් සපයනු ලැබේ. මීට අමතරව විවිධ උත්සව, සම්මේලන, සංගීත සංදර්ශන, රාජ්‍ය උත්සව, විභාග හා වැඩමුළු සඳහා පහසුකම් සපයනු ලැබේ.



ගෘහස්ථ ක්‍රීඩාගාරය

දෙරණ ඩ්‍රීම් ස්ටාර් 2015, දෙරණ ලිට්ල් ස්ටාර් 2015, 28වැනි ජෝතිපාල ගුණ සමරු සංගීත ප්‍රසංගය, බ්‍රිතාන්‍ය කවුන්සිලයේ ජාත්‍යන්තර තරඟ විභාග, ජාතික සහ ජාත්‍යන්තර කරාටේ ශූරතාවලින් මෙම වසරේ සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනයේ ගෘහස්ථ ක්‍රීඩාගාරයේදී පැවැත්විණ.

**2015 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා ගෘහස්ථ ක්‍රීඩාගාරයෙන් රු.31,326,015.00ක ආදායමක් උපදවා ඇත.**



දෙරණ ඩ්‍රීම් ස්ටාර් 2015



දෙරණ ලිට්ල් ස්ටාර් 2015

2015 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා ගෘහස්ථ ක්‍රීඩාංගනයේ පැවැති තරඟ/ ශූරතාවලි සහ වෙනත් උත්සව පිළිබඳ සාරාංශයන් පහත පරිදි වේ.

| අ.අ. | ක්‍රියාකාරකම | ජාතික | ජාත්‍යන්තර | එකතුව |
|---|---|---|---|---|
| 01 | ජිම්නාස්ටික් තරඟ | - | 05 | 05 |
| 02 | වොලිබෝල් තරඟ | - | 04 | 04 |
| 03 | බොක්සිං තරඟ | - | 05 | 05 |
| 04 | කරාටේ තරඟ | 03 | 11 | 14 |
| 05 | මේස පන්දු තරඟ | - | 01 | 01 |
| 06 | දැල්පන්දු තරඟ | - | 03 | 03 |
| 07 | සංගීත සංදර්ශන (මෙගා) | - | 02 | 02 |
| 08 | සංගීත සංදර්ශන (වෙළෙඳ නොවන) | - | 02 | 02 |
| 09 | සංගීත සංදර්ශන (වෙළෙඳ) | - | 01 | 01 |
| 10 | පැසිපන්දු තරඟ | - | 01 | 01 |
| 11 | බැඩ්මින්ටන් තරඟ | 01 | 01 | 02 |
| 12 | විභාග/ අධ්‍යාපනික වැඩසටහන් | - | 40 | 40 |
| 13 | සම්මාන උළෙල | - | 02 | 02 |
| 14 | ළමා ක්‍රියාකාරකම් උත්සව | - | 04 | 04 |
| 15 | සම්මේලන | - | 07 | 07 |
| 16 | ටයිකොන්ඩෝ තරඟ | - | 07 | 07 |
| 17 | ජාත්‍යන්තර බලූ සංදර්ශන | 01 | - | 01 |
| 18 | රැස්වීම් (පිහිණුම් තටාක දේශන ශාලාව) | - | 01 | 01 |
| 19 | පුහුණුවීම් | - | 22 | 22 |
| **එකතුව** | | **05** | **113** | **118** |

# උප ක්‍රීඩාගාරය





මෙම උප ක්‍රීඩාගාර බැඩ්මින්ටන් ක්‍රීඩා පිටි දෙකකින්
හා ස්කොෂ් ක්‍රීඩාගාර හතරකින් සමන්විත වන අතර, ක්‍රීඩා තරඟ හා පුහුණුවීම් කටයුතු සඳහා පහසුකම් සපයයි.

# පිහිණුම් තටාක සංකීර්ණය

ජාතික සහ ජාත්‍යන්තර මට්ටමේ සියලු පහසුකම් සහිත එකම පිහිණුම් තටාක සංකීර්ණය මෙම අධිකාරිය සතුව ඇති අතර, එය පහත දැක්වෙන අංගවලින් සමන්විත වේ.



1. ප්‍රධාන පිහිණුම් තටාකය



2. පුහුණුවීම් සඳහා උප පිහිණුම් තටාකය



3. කිමිදුම් තටාකය



4. ළමා පිහිණුම් තටාකය

මෙම පිහිනුම් සංකීර්ණය මඟින් පාසැල් පිහිනුම් තරඟ පැවැත්වීමේ සිට ජාත්‍යන්තර මට්ටමේ පිහිනුම් තරඟ පැවැත්වීම දක්වා අවශ්‍ය පහසුකම් සපයනු ලබන අතර, දිවා/ රාත්‍රී තරඟ සඳහා අධිබලැති විදුලි ආලෝක කුළුණු, විද්‍යුත් කාලඝණක යන්ත්‍ර වැනි පහසුකම් සපයා ඇත. මීට අමතරව, පාසැල් ළමුන් සඳහා පිහිනුම් පාසලක්ද පවත්වාගෙන යන අතර, මෙමඟින් ඉමහත් සහනදායී මුදලකට, පිහිනුම් තටාකාංගන පහසුකම් නොමැති ළමුන් සඳහා ඉතාමත් සහනදායි මුදලකට පහසුකම් සැපයීමෙන් විශාල මෙහෙයක් ඉටුකරනු ලබයි.

2015 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා පිහිනුම් තටාකවල පැවැති තරඟ/ ශූරතාවලි/ පුහුණුවීම් සාමාජිකත්ව පිළිබඳ සාරාංශයන් පහත පරිදි වේ.

| | |
|---|---|
| පාසල් ළමුන් සඳහා පිහිනුම් සාමාජිකත්ව | 480 |
| වැඩිහිටියන් සඳහා පිහිනුම් සාමාජිකත්ව | 188 |
| පිහිනුම් තරඟ | 25 |
| කිමිදුම් තරඟ | 04 |
| ජලපන්දු තරඟ | 08 |
| පුහුණුවීම් | 140 |
| පිහිනුම් පාසල් සාමාජිකත්ව | 100 |
| **එකතුව** | **945** |

**ඉහත තරඟ/ ශූරතාවලි/ පුහුණුවීම් සාමාජිකත්ව සැපයීමෙන් පිහිනුම් තටාකාංගනවලින් රු.6,340,313.00ක ආදායමක් උපදවා ඇත.**



සමස්ථ ලංකා පාසල් වයස් අන්තර පිහිනුම් තරඟාවලිය - 2015

# ගෘහස්ථ ක්‍රීඩාංගන කායවර්ධන මධ්‍යස්ථානය




මෙම ක්‍රීඩා සංකීර්ණය ස්ථාපනය කල යුගයේ සිට පවත්වාගෙන එනු ලබන කායවර්ධන මධ්‍යස්ථානයක් පවතින අතර, එම මධ්‍යස්ථානය 2013 වසරේදී නවීකරණය කොට ඒ සඳහා නවීන කායවර්ධන උපකරණද මිලදී ගනු ලැබිණ.

මෙම මධ්‍යස්ථානය මඟින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් මෙන්ම යාවජීව සාමාජිකයන් හා වාර්ෂිකව සාමාජිකත්වය ලබා ඇති පිරිසක්ද අවශ්‍ය පහසුකම් ලබා ගනී.

**2015 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා කායවර්ධන මධ්‍යස්ථානයෙන් රු.1,353,040.00ක ආදායමක් උපදවා ඇත.**

# ක්‍රීඩා හෝටලය

මෙම ක්‍රීඩා හෝටලය පහත අංගවලින් සමන්විත වේ.

| | |
|---|---|
| තනි කාමර | 06 |
| යුගල කාමර | 14 |
| වායුසමනය කළ යුගල කාමර | 04 |
| සමූහ කාමර | 18 |

සුගතදාස ක්‍රීඩා සංකීර්ණය ස්ථාපනය කළ යුගයේ සිට පවත්වාගෙන එනු ලබන මෙම ක්‍රීඩා හෝටලය කාමර 42කින් සහ 100 දෙනෙකුට ආසන්න ප්‍රමාණයකට රැස්විය හැකි කාමර පහසුකම්වලින්ද, ක්‍රීඩකයන්ට නවාතැන්ගත හැකි සමූහ කාමර පහසුකම්වලින්ද සමන්විත වේ. මෙම හෝටලය මඟින් කාමර සහසුකම් සැපයීමට අමතරව විවාහ මංගල උත්සව, රැස්වීම් හා වැඩමුළු සඳහා අවශ්‍ය පහසුකම්ද සපයනු ලබයි. ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ සුබසාධනය සඳහා ප්‍රමුඛත්වය ලබාදෙමින් ඔවුන්ට සහ ජාතික ක්‍රීඩා සංගම් සඳහා සහනදායී පදනම මත මෙම හෝටලයේ පහසුකම් ලබා දෙනු ලැබේ.

ක්‍රීඩාංගනයේ අවශ්‍යතාවයන්ට බාධා නොවන පරිදි ඉඩකඩ පවතින අවස්ථාවන්වලදී සාමාන්‍ය ජනතාව සඳහා පහසුකම් ලබාදීම සිදු කරයි.

**2015 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා ක්‍රීඩා හෝටලයෙන් 5,665,945.00ක ආදායමක් උපදවා ඇත.**

## සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනය ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය (2015 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට)

| | කාර්යය | ඇස්තමේන්තු වටිනාකම (රු.මිලියන) | 2014 වසර සඳහා (රු.මි.) | | 2015 වසර සඳහා (රු.මි.) | | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|
| | | | ප්‍රතිපාදන | වියදම | ප්‍රතිපාදන | වියදම | |
| 01 | සමස්ථ ක්‍රීඩා හෝටලය ප්‍රතිසංස්කරණය හා නවීකරණය කිරීම. | 31.00 | - | - | 31.00 | 23.18 | ව්‍යාපෘතිය ක්‍රියාත්මකයි. |
| 02 | ගෘහස්ථ ක්‍රීඩාගාරයේ වහල සහ ලී පොළොව අලුත්වැඩියා කිරීම. | 30.00 | - | - | 30.00 | 30.10 | ව්‍යාපෘතිය ප්‍රදානය කරන ලදී. |
| 03 | ගෘහස්ථ/ එළිමහන් ක්‍රීඩාංගන සඳහා තිර රෙදි යෙදීම. | 2.00 | - | - | 2.00 | | භෞතික කාර්යයන් සම්පූර්ණයි. |
| 04 | පරිගණක උපාංග සහ මෘදුකාංග. | 3.00 | - | - | 3.00 | 1.163 | භෞතික කාර්යයන් සම්පූර්ණයි. |
| 05 | ගෘහස්ථ/ එළිමහන් ක්‍රීඩාංගනවල ඩිජිටල් දැන්වීම් පුවරු සවිකිරීම. | 10.00 | - | - | 10.00 | | සියයට 50ක වැඩ අවසන්. |
| 06 | කාර්යාලීය උපකරණ මිල දී ගැනීම. | 2.00 | - | - | 2.00 | 0.252 | වැඩ අවසන්. |
| 07 | ගෘහස්ථ ක්‍රීඩාගාරයේ විශේෂ අමුත්තන්ගේ විවේකාගාරය සඳහා පුටු සහ ගෘහ භාණ්ඩ මිලදී ගැනීම. | 2.00 | - | - | 2.00 | | |
| 08 | ක්‍රීඩා උපකරණ මිලදී ගැනීම. | 5.00 | - | - | 5.00 | | ක්‍රීඩා අමාත්‍යාංශයට මිලට ගැනීමට යොමුකරන ලදී. |
| 09 | වෙනත් | 6.02 | - | - | 6.02 | | අවසන් |

## සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනයේ 2016 වර්ෂය සඳහා යෝජිත සංවර්ධන ව්‍යාපෘති

| | ව්‍යාපෘතිය | අයවැය ප්‍රතිපාදන 2016 (රු.මිලියන) |
|---|---|---|
| 01 | ක්‍රීඩා හෝටලය ප්‍රතිසංස්කරණය කිරීම. | 60.00 |
| 02 | ගෘහස්ථ ක්‍රීඩාගාරයේ වහල සහ ලී පොලොව ප්‍රතිසංස්කරණය. | 141.35 |
| 03 | ගෘහස්ථ ක්‍රීඩාංගනයේ ටයිල් ඇතිරිම සහ Water Proofing කිරීම. | 33.65 |
| **එකතුව** | | **235.00** |

# එළිමහන් ක්‍රීඩාංගනය




දිවා සහ රාත්‍රී කාලවලදී ජවන හා පිටිය ක්‍රීඩා තරඟ පැවැත්වීමට හැකි ආකාරයට මෙම ක්‍රීඩාංගනය සකසා ඇත. මෙම ක්‍රීඩාංගනයේ එකවර ප්‍රේක්ෂකයින් 20,000 කට පමණ තරඟ නැරැඹිය හැකි ආකාරයට ක්‍රීඩාගාර පහසුකම් සපයා ඇත.

ක්‍රීඩාංගනයේ මීටර් 400 හා මීටර් 200 වශයෙන් කෘත්‍රිම ධාවන පථ 02ක් ඇත. මීට අමතරව මහල් තුනකින් යුත් මාධ්‍ය කුටියක්, අධිබලැති විදුලි ආලෝක පද්ධතියක් මඟින් රාත්‍රී ක්‍රීඩා තරඟ පැවැත්වීමට අවශ්‍ය පහසුකම් සපයා ඇත. මෙම ක්‍රීඩා පිටියේ මළල ක්‍රීඩා, වොලිබෝල්, රගර්, පාපන්දු, පැසිපන්දු ක්‍රීඩා මෙන්ම විවිධ උත්සව සඳහාද පහසුකම් සපයනු ලැබේ.

**2015 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනයේ පැවැත්වූ තරඟ හා උත්සව පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.**

| අ.අ. | ක්‍රියාකාරකම | ජාතික | ජාත්‍යන්තර | එකතුව |
|---|---|---|---|---|
| 01 | පාපන්දු තරඟ | 01 | 36 | 37 |
| 02 | ක්‍රීඩා උත්සව (පාසල් නිවාසාන්තර තරඟ) | - | 27 | 27 |
| 03 | ක්‍රීඩා උත්සව (මීටර් 200 ධාවන පථය) | - | 60 | 60 |
| 04 | මළල ක්‍රීඩා තරඟ | - | 23 | 23 |
| 05 | රගර් තරඟ | - | 26 | 26 |
| 06 | පුහුණුවීම් | - | 267 | 267 |
| 07 | ව්‍යායාම සඳහා ඇවිදීමේ සාමාජිකත්ව | - | 158 | 158 |
| 08 | එල්ලේ තරඟ | - | 01 | 01 |
| 09 | පාපන්දු පුහුණුවීම් | - | 06 | 06 |
| 10 | තෝරා ගැනීමේ තරඟ | - | 08 | 08 |
| 11 | වෙනත් | - | 03 | 03 |
| **එකතුව** | | **01** | **615** | **616** |



මීටර් 400 කෘත්‍රිම ධාවන පථය සහිත එළිමහන් ක්‍රීඩාංගනය

**2015 වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනයේ පැවැත්වූ තරඟ, උත්සව, ඩී රථගාල, බදු කුලී හා වෙනත් ප්‍රභවයන් මගින් රු.32,028,049.00ක ආදායමක් උපදවා ඇත.**

## සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනය ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය (2015 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට)

| | කාර්යය | ඇස්තමේන්තු වටිනාකම (රු.මිලියන) | 2014 වසර සඳහා (රු.මි.) | | 2015 වසර සඳහා (රු.මි.) | | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|
| | | | ප්‍රතිපාදන | වියදම | ප්‍රතිපාදන | වියදම | |
| 01 | පරිපාලන ගොඩනැගිල්ල සහ ක්‍රීඩා භාණ්ඩ අලෙවිසැල් ඉදිකිරීම - තෙවන අදියර | 20.00 | - | - | 20.00 | 6.971 | ක්‍රියාත්මක වෙමින් පවති. |
| 02 | පරිපාලන ගොඩනැගිල්ල සහ ක්‍රීඩා භාණ්ඩ අලෙවිසැල් ඉදිකිරීම - තෙවන අදියර (A) Balance Work | 26.78 | - | - | 26.78 | | ව්‍යාපෘතිය ප්‍රදානය කරන ලදි. |
| 03 | ට්‍රාන්ස්ෆෝමරයේ පවත්නා විදුලි සැපයුම කි.වො.ඇ. 250 සිට 450 දක්වා වැඩිකිරීම. | 3.00 | - | - | 3.00 | 2.41 | ව්‍යාපෘතිය අවසන්. |
| 04 | සමස්ථ එළිමහන් ක්‍රීඩාංගනයේ ප්‍රතිසංස්කරණ, සුළු අලුත්වැඩියාවන් සහ තීන්ත ආලේපනය කිරීම. | 11.50 | - | - | 11.50 | 1.803 | ව්‍යාපෘතිය ප්‍රදානය කරන ලදි. |
| 05 | නේවාසිකාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම. | 0.031 | - | - | 0.031 | 0.031 | ප්‍රතිපාදන වෙනත් ව්‍යාපෘතීන් සඳහා යොමුකරන ලදී. |
| 06 | සමස්ථ එළිමහන් ක්‍රීඩාංගනයේ වැසිකිලි සහ නාන කාමර ඉදිකිරීම. | 32.28 | - | - | 32.28 | 16.999 | ක්‍රියාත්මක වෙමින් පවති. |
| 07 | පැස්පන්දු පිටි සංකීර්ණය (කුඩා ගෘහස්ථ ක්‍රීඩාංගනයේ) ඉදිකිරීම - පළමු අදියර | 0.047 | - | - | 0.047 | 0.047 | ප්‍රතිපාදන වෙනත් ව්‍යාපෘතීන් සඳහා යොමුකරන ලදී. |
| | **එකතුව** | **93.638** | - | - | **93.638** | **28.261** | |

## සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනයේ 2016 වර්ෂය සඳහා යෝජිත සංවර්ධන ව්‍යාපෘති

| | ව්‍යාපෘතිය | අයවැය ප්‍රතිපාදන 2016 (රු.මිලියන) |
|---|---|---|
| 01 | මීටර් 400, මීටර් 200, මීටර් 80 කෘතිම ධාවන පථ නැවත ඇතිරීම. | 500.00 |
| 02 | පාපන්දු පිටියේ අලුත්වැඩියා කටයුතු/ විදුහුත් ලකුණු පුවරුව ස්ථාපනය කිරීම/ ආරක්ෂක වැට සහ ඇතුළුවීමේ ගේට්ටුව ඉදිකිරීම. | 100.00 |
| | **එකතුව** | **600.00** |

# ආර්.ප්‍රේමදාස ක්‍රිකට් ක්‍රීඩාංගනය

ආර්.ප්‍රේමදාස ක්‍රිකට් ක්‍රීඩාංගනය අප රට සතු ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ ක්‍රිකට් තරඟ පැවැත්වීමට අවැසි සියලු පහසුකම්වලින් සමන්විත එක් ක්‍රීඩාංගනයකි. මෙහි එකවර ප්‍රේක්ෂකයින් 35,000කට පමණ තරඟ නැරැඹීමේ පහසුකම් ඇති අතර, විශාල රථ ගාලකින්ද යුක්ත වේ. මෙම ක්‍රීඩාංගනය 2006-05-10 දින ගනු ලැබූ කැබිනට් මණ්ඩල තීරණයක් අනුව 2006-11-01 දින සිට වසර තිහක කාලයක් සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට මසකට රු. 250,000/- ක මුදලකට බදු දී ඇත. ඒ අනුව, 2015 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා මෙම ක්‍රීඩාංගනය මගින් රු. 3,500,000.00ක ආදායමක් උපදවා ඇත.

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ ප්‍රධානතම ආදායම් මාර්ගයක්ව පැවැති මෙම ක්‍රීඩාංගනය දීර්ඝ කාලීනව මාසික නොවෙනස් බදු කුළියක් සහිතව බදුදීම මෙම අධිකාරියේ ආදායම පහත වැටීමට බලපා ඇත.



# බෝගම්බර එළිමහන් ක්‍රීඩාංගනය

මෙම ක්‍රීඩාංගනය මහනුවර නගර සභාව විසින් පාලනය කරන ලද අතර, 1999 සිට අප අධිකාරිය මඟින් පාලනය කරනු ලැබේ. මෙම එළිමහන් ක්‍රීඩාංගනය තුළ එකවර ප්‍රේක්ෂකයින් 10,000කට පමණ තරග නැරැඹිය හැකි ආකාරයේ ක්‍රීඩාගාර පහසුකම් ඇත. මෙහි මළල ක්‍රීඩා, පාපන්දු, රගර්, වොලිබෝල්, දැල්පන්දු, පාසැල් ක්‍රීඩා උත්සව හා වෙනත් උත්සව සඳහා පහසුකම් ඇත.

මෙම ක්‍රීඩාංගනය සඳහා නව කායවර්ධන මධ්‍යස්ථානයක් ඉදි කර ඒ සඳහා නවීන කායවර්ධන උපකරණද මිදී ගනු ලැබූ අතර ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මෙන්ම වෙනත් පාර්ශවයන්හටද මෙහි සාමාජිකත්වය ලබාගෙන අවශ්‍ය පහසුකම් ලබාගත හැක.





ප්‍රසිද්ධ සංගීත සංදර්ශන ආදියට එළිමහන් රථගාල භාවිතා කරමින් ආදායම ඉහළ නැංවිය හැකි වුවත් ක්‍රීඩාංගනයේ තිබෙන ක්‍රීඩා පහසුකම්වලට හානි සිදුවිය හැකි බැවින් එසේ සිදු කරනු නොලැබේ.

**2015 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා මෙම ක්‍රීඩාංගනයේ පැවැත් වූ තරඟ හා උත්සව, රථ ගාලෙන්, කායවර්ධන මධ්‍යස්ථානය මඟින් හා වෙනත් ප්‍රභවයන්ගෙන් රු.9,522,464.00ක ආදායමක් උපදවා ඇත.**

**බෝගම්බර එළිමහන් ක්‍රීඩාංගනය ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය (2015 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට)**

| | කාර්යය | ඇස්තමේන්තු වටිනාකම (රු.මිලියන) | 2014 වසර සඳහා (රු.මි.) | | 2015 වසර සඳහා (රු.මි.) | | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|
| | | | ප්‍රතිපාදන | වියදම | ප්‍රතිපාදන | වියදම | |
| 01 | දුනුමඩලාව ඇල සංවර්ධන ව්‍යාපෘතිය - තෙවන අදියර | 31.00 | - | - | 31.00 | 28.769 | අවසන් |
| 02 | දුනුමඩලාව ඇල සංවර්ධන ව්‍යාපෘතිය - තෙවන අදියර | 33.15 | - | - | 33.15 | 18.642 | අනෙක් අදියර වෙත රැගෙන යන ලදී. |
| 03 | දුනුමඩලාව ඇල සංවර්ධන ව්‍යාපෘතිය - තෙවන අදියර | 23.59 | - | - | 23.59 | | ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පවතී. |
| 04 | ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා විවේකාගාර සහ නාන කාමර ඉදි කිරීම. | 3.00 | - | - | 3.00 | 1.317 | අවසන් |
| 05 | සියලුම ප්‍රේක්ෂකාගාර සහ නාන කාමර ප්‍රතිසංස්කරණය කිරීම. | 2.00 | - | - | 2.00 | 1.886 | ව්‍යාපෘතිය අවසන් |
| 06 | ෆයිබර් ආසන අලුතින් සවිකිරීම/ ක්‍රීඩාගාරයේ හානි වූ ආසන ප්‍රතිසංස්කරණය කිරීම. | 7.60 | - | - | 7.60 | 3.852 | සියයට 75ක් වැඩ අවසන්. |
| | **එකතුව** | **100.34** | **-** | **-** | **100.34** | **54.448** | |

**බෝගම්බර කායවර්ධන මධ්‍යස්ථානය**







# බෙලිඅත්ත හා වීරකැටිය පිහිණුම් තටාක



බෙලිඅත්ත කිමිඳුම් තටාකය



බෙලිඅත්ත ප්‍රධාන පිහිණුම් තටාකය



වීරකැටිය පිහිණුම් තටාකය

**මෙම පිහිණුම් තටාක පහත අංගවලින් සමන්විත වේ.**

**බෙලිඅත්ත**

1. මංතීරු 08ක් සහිත මීටර් 50ක් දිගැති පිහිණුම් තටාකය
11. කිමිඳුම් තටාකය

**වීරකැටිය**

1. මංතීරු 08ක් සහිත මීටර් 25ක් දිගැති පිහිණුම් තටාකය

බෙලිඅත්ත කාර්මික විදුහලේ හා වීරකැටිය රාජපක්ෂ මධ්‍ය මහා විද්‍යාලයේ පිහිණුම් තටාකවල පරිපාලනය හා නඩත්තු කටයුතු පමණක් 2008-08-07 දින සිට සුගතදාස අධිකාරිය විසින් සිදු කරනු ලැබුවත් මෙම පිහිණුම් තටාකවල අයිතිය සුගතදාස අධිකාරිය සතු නොවේ. අවට ප්‍රදේශවල වැඩිහිටියන් හා පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් හට පිහිණුම් කටයුතු සඳහා පහසුකම් සැපයීම සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය විසින් සිදු කරනු ලබයි.

මෙම පිහිනුම් තටාකවල 2015 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා මුළු ආදායම **රු.639,816.00ක්** වේ. මෙම පිහිනුම් තටාක දෙක පිළිබඳව වැඩිහිටියන්, පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සහ ක්‍රීඩා සමාජ දැනුවත් කළද සහභාගිත්වය ඉතාමත් අඩු බැවින් ඉහළ ආදායමක් අපේක්ෂා කළ නොහැක.

තවද, වීරකැටිය පිහිනුම් තටාකය පිහිටා ඇත්තේ වීරකැටිය මධ්‍ය විද්‍යාල භූමිය තුළය. ඒ අනුව, පිහිනුම් තටාකයට ප්‍රවේශයද විදුහලේ ප්‍රධාන දොරටුවෙන් සිදුවන බැවින්, පිහිනුම් තටාකය ඌන උපයෝජනයකට පත්ව ඇත. මෙම පිහිනුම් තටාකවල නඩත්තු කටයුතු සඳහා දරන වියදමට සාපේක්ෂව ආදායමක් නොලබන බවද සඳහන් කළ යුතුය.

# නුවරඑළිය තුරඟ තරඟ පිටිය

2011-09-07 දින ක්‍රීඩා අමාත්‍යාංශය විසින් නුවරඑළිය තුරඟ තරඟ පිටියේ කළමනාකාරිත්වය සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියට පවරන ලදී.





භූමි ප්‍රමාණය හෙක්ටයාර 34,564ක් වූ මෙම තුරඟ තරඟ පිටියෙන් 2015 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා අශ්ව ගාල්වලින්, බදුකුළී, අශ්ව/ පෝනි ඇවිදීම වෙනුවෙන් සියයට 10ක කුළී, උත්සව සමය සඳහා භූමිය කුළී පදනම මත ලබා දීම හා රථ වාහන නවතා තැබීමේ කුළී යන ප්‍රභව මඟින් **රු.3,310,891.00ක** ආදායමක් උපයා ගනු ලැබිය.

# ආයතනයේ සමස්ථ ප්‍රගතිය

2015 වර්ෂයේ අධිකාරියේ ක්ෂය හා පාරිතෝෂික වෙන්කිරීම සමඟ මෙහෙයුම් වියදම රු.332,114,666.00කි. මින් රු.89,841,680.00ක මුදලක් ස්ථාවර වත්කම් සඳහා ක්ෂය වෙන්කිරීමක් වේ.

2015 වර්ෂය සඳහා අධිකාරිය මහා භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන ප්‍රතිපාදන ලෙස රු.243,000,000.00ක් හා වර්තන ප්‍රතිපාදන ලෙස රු.131,750,000.00ක මුදලක් ලබාගෙන ඇත.

2015 වර්ෂයේ අධිකාරිය උපයා ඇති ආදායම රු.99,621,445.00ක් වන අතර, එය 2014 වර්ෂයට වඩා රු.34,992,303.00ක අඩුවීමකි.

2015 වර්ෂයේ වියදම 2014 වර්ෂයට වඩා වැඩිවීමට වැටුප් හා දීමනා රු.31,440,679.00ක් ලෙස වැඩිවීම ප්‍රධාන ලෙස බලපා ඇත.

2015 වර්ෂයේ අධිකාරිය උපයා ඇති ආදායම රු.99,621,445.00ක් වූ අතර, ක්ෂය වෙන්කිරීම් සමඟ මුළු වියදම රු.332,114,666.00ක් විය.

**2008 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ආයතනය විසින් උපයා ඇති ආදායම් පහත පරිදි විචලනය වී ඇත.**

| වර්ෂය | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් (රු. මිලි) | 54.78 | 57.85 | 61.60 | 69.00 | 77.17 | 89.03 | 134.61 | 99.62 |

# ආයතනයේ මුළු ණය

2008 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා තිබූ ණය තත්ත්වය පහත ආකාරයට විචලනය වී ඇත.

| වර්ෂය | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|---|---|---|---|
| ණය (රු. මිලි) | 2.30 | 4.61 | 133.03 | 42.95 | 42.04 | 41.00 | 45.00 | 44 |

2011, 2012, 2013 වර්ෂ සැලකිමේදී පැවැති ණය තත්ත්වය සිඝ්‍ර අඩුවීමක් දක්නට ලැබුණත් 2014 වර්ෂයේදී එහි ඉහල යාමක් දක්නට ලැබේ.

**සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය**

# ගිණුම්කරණ ප්‍රතිපත්ති
# 2015

## 01. සාමාන්‍ය

### 1.1 අනුකූලවීමේ ප්‍රකාශය

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ ගිණුම් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇත.

### 1.2 පිළියෙල කිරීමේ පදනම

මුලය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර ඉඩම් ගොඩනැගිලි සහ යන්ත්‍ර සූත්‍ර ප්‍රත්‍යාගණනය සඳහා වූ ගැලපිලි කිරීම්වල දක්වා ඇත. මෙහිදී උද්ධමන තත්ත්වයන් සැලකිල්ලට ගෙන නොමැත.

### 1.3 ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම

ශේෂ පත්‍ර දිනට පසුව සිදුවන සියලුම ප්‍රමාණාත්මක බලපෑම් තිබේනම් ඒ සඳහා මුලය වාර්තාවල අවශ්‍ය ගැලපීම් සිදුකර ඇති අතර එම ගැලපීම් ගිණුම්වල හෙළිදරව් කර ඇත.

## 02. වත්කම් සහ ඒවා අගය කිරීමේ පදනම

ශේෂපත්‍රයෙහි පෙන්නුම් කරන වත්කම්වලින් ජංගම වත්කම් ලෙස හඳුනාගෙන ඇත්තේ මුදල් සහ බැංකු ශේෂයන් සහ සාමාන්‍ය ගණුදෙනු ක්‍රියාවලිය තුලදී වසරක් තුල මුදල් බවට පරිවර්තනය විය හැකි යැයි සැලකෙන අයිතම වේ.

### 2.1 වත්කම්

දේපල , පිරියත හා යන්ත්‍ර උපකරණ යන වත්කම්වල අගය පෙන්වා ඇත්තේ සමුච්චිත ක්ෂය අඩුකල පසු අගයටය.

ගොඩනැගිලි වත්කම්වල අඩංගු වන පිරිවැය වන්නේ ද්‍රව්‍ය හා සෘජු ශ්‍රම පිරිවැයයි. එසේම ස්ථාවර වත්කම් ප්‍රධාන උප අංගවලට වෙන්කර ඇත්තේ ඒවායේ ප්‍රයෝජනයට ගනු ලැබූ කාලය සලකා බලාය.

<u>ආර් ප්‍රේමදාස ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය</u>

ආර් ප්‍රේමදාස ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය 2006-11-01 දින සිට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන් මසකට රු. 250,000/- අයකිරීම් පදනම මත වසර 30ක කාලයකට බදු පදනම යටතේ ලබාදී ඇත. 2006-12-31 වන දින වනවිට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය මඟින් ඉදිකරන ලද ගොඩනැගිල්ල සඳහා සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියට රු.25,753,844.64 මුදලක් අයවිය යුතුව තිබෙන අතර ඒ පිළිබඳව හා වර්තමානයේ අයකරනු ලබන මාසික කුලිය පිළිබඳව දෙපාර්ශවය අතර එකඟතාවයට පැමිණීමට බලාපොරොත්තු වේ.

<u>බෙලිඅත්ත හා වීරකැටිය පිහිණුම් තටාක සංකීර්ණය</u>

බෙලිඅත්ත කාර්මික විදුහලේ හා වීරකැටිය රාජපක්ෂ මධ්‍ය මහා විදුහලට අයත්ව තිබූ පිහිණුම් තටාක දෙක සහ කිමිදුම් තටාකය 2008 වසරේ අගෝස්තු 07 දින සිට සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය විසින් නඩත්තු කටයුතු සිදුකරනු ලබයි. අධිකාරියේ කළමනාකරණ අනුමැතිය මත සේවකයින් දස (10) දෙනෙක් තාවකාලික පදනම මත අනුයුක්ත කර ඇත.

2008 වසරේ මෙම පිහිණුම් තටාකවල වියදම් ගෘහස්ථ ක්‍රීඩාංගණයේ වියදම් ලෙෂ ගිණුම් ගත කලද කළමනාකරණ මණ්ඩල තීරන මත 2009 වසරේ සිට මෙම පිහිණුම් තටාකවල වියදම් වෙනම ගිණුම්වල දැක්වේ.

### 2.2 අනෙකුත් වියදම්

දේපල පිරියත හා උපකරණ තුල අඩංගු කොටස් නැවත ස්ථාපිත කිරිම සඳහා දරණ ලද වියදම් වෙනම ගිණුම්ගත කර ඇති අතර ඒවා ප්‍රාග්ධනික කර ප්‍රයෝජනවත් ආයුකාලය තුල ලියාහැරීම සඳහා ගිණුම්ගත කර ඇත. අනෙකුත් වියදම් ප්‍රාග්ධනීත කර ඇත්තේ එම වියදම් මගින් වත්කම්වල අනාගත ආර්ථික ප්‍රතිලාබවල වර්ධනයක් සිදුවන වියදම් වන අතර අනෙකුත් සියලුම වියදම් ආදායම් ප්‍රකාහනයට ගලපා ඇත.

## 2.3 ක්ෂයවීම්

ක්ෂය ප්‍රතිපත්තිය ලෙස සරල මාර්ග ක්‍රමය අනුගමනය කරනු ලබන අතර වත්කම්වල ක්ෂයවීම් සිදුකරන්නේ වත්කම් මිලදී ගත් වර්ෂයේ හෝ ඉදිකිරීම් සම්පූර්න කල වසරේ සිටය. ක්ෂය අපේක්ෂිත ආයුකාලය තුල ආදායම් වියදම් ගිණුමට ලියා හැර ඇත. ඉඩම් සඳහා ක්ෂයවීම් සිදුකර නොමැත.

| | |
|---|---|
| ➢ ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 2.5% |
| ➢ අධිබලැති විදුලි කුලුණු | 10% |
| ➢ කෘතිම ධාවන පථය | 20% |
| ➢ යන්ත්‍ර හා උපකරණ | 10% |
| ➢ පරිගණක | 25% |
| ➢ මෝටර් රථ | 20% |
| ➢ ක්‍රීඩා උපකරණ | 10% |
| ➢ ලී බඩු හා උපකරණ | 10% |
| ➢ කාර්යාලිය උපකරණ | 10% |
| ➢ තිරරෙදි | 50% |
| ➢ අධිබලැති විදුලි බල්බ සහ පිවලකය (ඉග්නයිටර්) | 33 1/3% |

32-5811 දරණ පැජරෝ රථය මිනිස්බල හා යෙදවුම් අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කර ඇති හෙයින් අප අධිකාරියේ වත්කමක් ලෙස සැලකිය නොහැක. ඊට අදාල නඩත්තු හා අනෙකුත් වියදම් අධිකාරියේ ආදායම් වියදම් ප්‍රකාශයේ දක්වා ඇත.

64-3180 දරණ පැජරෝ රථය ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කර ඇති හෙයින් අප අධිකාරියේ වත්කමක් ලෙස සැලකිය නොහැක. ඊට අදාල නඩත්තු හා අනෙකුත් වියදම් අධිකාරියේ ආදායම් වියදම් ප්‍රකාහයේ දක්වා ඇත.

ජාතික අයවැය චක්‍රලේඛ 150ට අනුව මහා භාණ්ඩාගාරයෙන් රු.9,100,000ක් වටිනා NB-1527 අංක දරන නව වෑන් රථය ලබාදී ඇත. එම වාහනයේ වටිනාකම ලෙස රක්ෂිත වටිනාකම ගිණුම්ගත කර ඇත.

ජාතික අයවැය චක්‍රලේඛ 150ට අනුව මහා භාණ්ඩාගාරයෙන් රු.7,500,000ක් වටිනා PD-9713 අංක දරන නව කැබ් රථය ලබාදී ඇත. එම වාහනයේ වටිනාකම ලෙස රක්ෂිත වටිනාකම ගිණුම්ගත කර ඇත.

ජාතික අයවැය චක්‍රලේඛ 150ට අනුව මහා භාණ්ඩාගාරයෙන් රු.210,267.86ක් වටිනා BBG-3006 අංක දරන නව යතුරු පැදිය ලබාදී ඇත. එම යතුරු පැදියේ වටිනාකම ලෙස රක්ෂිත වටිනාකම ගිණුම්ගත කර ඇත.

## 2.4 වෙළඳ හා අනෙකුත් ණය ගැනීම්

වෙළඳ හා අනෙකුත් ණය ගැනීම් මූල්‍ය ප්‍රකාශවල දක්වා ඇත්තේ ඒවායේ ශුද්ධ උපලබ්දිත අගය මතය.

## 2.5 තොග

තොග මූල්‍ය වාර්තාවල දක්වා ඇත්තේ පිරිවැයටය. තොග වටිනාකම්වල ප්‍රථම ලැබුම්, ප්‍රථම නිකුතු ක්‍රමය මත තිරණය කරන අතර එයට මිලදී ගැනුම් පිරිවැය හා තොග වර්තමාන තත්ත්වය හා අදාල ස්ථානයට ගෙනෙන තෙක් දරණ සියලුම වියදම්වලට අදාල වේ.

## 03. වෙන්කිරීම් හා වගකීම්

මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේදී හඳුනා ගන්නා ලද සියලුම වගකීම් ගිණුම්ගත කර ඇත. මූල්‍ය වාර්තාවල ජංගම වගකීම් ලෙස හඳුනාගෙන ඇත්තේ ශේෂපත්‍ර දින සිට වසරක් තුල ගෙවා නිමකල යුතු හෝ ඉල්ලූවිට ගෙවිය යුතු වගකීම් වේ. ජංගම නොවන වගකීම් යනු වසරකට වඩා වැඩි කාලයක් තුලදී ගෙවා නිමකල යුතු වගකීම් ය. **3.1 සේවක හිමිකම්**

සේවක අර්ථසාදක අරමුදල හා සේවක භාරකාර අරමුදල කරන ලද දායකත්වයන් මූල්‍ය වාර්තාවල වියදම් ලෙස හඳුනාගෙන ඇත.

### 3.2 වෙළඳ හා අනෙකුත් ගෙවීම්

වෙළඳ හා අනෙකුත් ගෙවීම් ඒවායෙහි පිරිවැය මත මූල්‍ය වාර්තාවල දක්වා ඇත.

### 3.3 සේවක විශ්‍රාම පාරිතෝෂික

පාරිතෝෂික සඳහා මූල්‍ය වාර්තාවල වෙන්කිරීම් සිදුකර ඇති අතර ප්‍රථම සේවා වර්ෂයේ සිටම සෑම සේවකයෙක්ම මෙම වෙන්කිරීම් සඳහා සලකා ඇත. මෙය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16ට අනුකූල වන ලෙස සිදුකර ඇත. කෙසේ වෙතත් මෙම ගෙවීම් සිදුකරනු ලබන්නේ 1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීම් පනත අනුව හිමිකම් ලබා අඛණ්ඩ වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කල සේවකයන්ට පමණි.

## 04. ආදායම් ප්‍රකාශය

### 4.1 ආදායම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 29 අනුව අදාල සේවාවන් සැපයීමෙන් පසු උපචිත පදනම මත ආදායම් හඳුනාගෙන ඇත.

### 4.2 වියදම්

ආදායම් විස්තරයේ ලාභය හෝ අලාභය හඳුනාගෙන ඇත්තේ බදුවලට පෙර හා සියලුම හඳුනාගත් වගකීම් සඳහා වෙන්කිරීම් කිරීමෙන් පසුය.

ශුද්ධ හිඟය ගණනය කිරීමේදී වත්කම් නඩත්තු කිරීමේ සහ ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා දරණ ලද වියදම් ආදායම් විස්තරයට ගලපා ඇත.

ආයතනයේ පහසුකම් ලබාදී ඇති නිලධාරීන් සහ සේවකයිනීගෙන් දුරකථන, විදුලි, ජල බිල්පත් සහ කුලී අයකරනු ලබන අතර අදාල වියදම් තිරු තුල පෙන්වා ඇත.

**මූල්‍ය වියදම්**

ස්ථාවර තැන්පතුවල පොලී ආදායම උපචිත ක්‍රමයට ගිණුම්ගත කර ඇත. පොලී වියදම් සහ අනෙකුත් ණය වියදම්, මූල්‍යය වියදම් ගණනය කිරීමේදී ගලපා ඇත.

**දීමනා**

ප්‍රදාන හා ආධාර ඊට අදාල වියදම්වලට සරිලන පරිදි ගලපා ඇත. වත්කම්වලට අදාල මූල්‍යමය නොවන ප්‍රදාන එහි මූල්‍ය වටිනාකමට ගිණුම්ගත කර ඇති අතර එම වත්කම් ප්‍රයෝජනවත් ආයුකාලය තුලදී ආදායම් ප්‍රකාශයට ලියාහරිනු ලැබේ.

## 05. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

### 5.1 මුදල්

මුදල් යනුවෙන් හඳුන්වා ඇත්තේ අත ඉතිරි මුදල් සහ ඉතා ඉහල ද්‍රව ශීලතාවයක් සහිතව මුදල් බවට පරිවර්තනය කළහැකි එසේ පරිවර්තනය කිරීමේදී කිසිදු අවධානමක් රහිත වත්කම් වේ. මේ සඳහා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් යනු, ඇතැති මුදල් හා බැංකු මුදල් වේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකසා ඇත්තේ වක්‍ර ක්‍රමය පදනම් කරගෙනය.

## 06. ශේෂපත්‍ර දිනට පසු සිදුවීම්

ශේෂපත්‍ර දිනට පසු වූ ප්‍රමාණාත්මක සිදුවීම් සියල්ල සැලකිල්ලට ගෙන ඇති අතර අවශ්‍ය ගැලපීම් ගිණුම් මගින් හෙලිදරව් කර ඇත.

# සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය

1. ආදායම් වියදම් ප්‍රකාශය
2. ශේෂ පත්‍රය
3. අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය

# ආදායම් වියදම් ප්‍රකාශය

**2015 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් වියදම් ප්‍රකාශය**

| | 2015.12.31 (රුපියල්) | 2014.12.31 (රුපියල්) |
|---|---|---|
| **ආදායම** | **99,621,445** | **134,613,748** |
| **ප්‍රදානය කරන ලද ආදායම** | | |
| රජයේ භාණ්ඩාගාර ප්‍රතිපාදන | 131,750,000 | 100,980,000 |
| **මුළු ආදායම** | **231,371,445** | **235,593,748** |
| **වියදම්** | | |
| **මෙහෙයුම් වියදම්** | | |
| සේවක වේතන වියදම් | (156,284,285) | (124,843,606) |
| කළමනාකාරීත්ව මණ්ඩලයේ දීමනා හා වියදම් | (359,500) | (489,500) |
| පාරිතෝෂික වෙන්කිරීම් | (4,224,894) | (3,548,586) |
| බොල් ණය සඳහා වෙන්කිරීම් | (32,898,350) | - |
| ක්ෂයවීම් | (89,841,680) | (88,122,824) |
| අනෙකුත් වියදම් | (48,505,958) | (87,444,041) |
| මුළු වියදම් | (332,114,666) | (304,448,557) |
| **මෙහෙයුම් අතිරික්තය** | **(100,743,221)** | **(68,854,810)** |
| මූල්‍ය පිරිවැය | (33,352,622) | (3,598,301) |
| **වාර්ෂික බදු අයකර ගැනීමට පෙර අතිරික්තය/හිඟය** | **(134,095,844)** | **(72,453,110)** |
| **එකතුකිරීම්: මෙහෙයුම් නොවන ආදායම** | | |
| ස්ථාවර තැන්පතු පොලි ආදායම | 117,000 | 1,184,387 |
| **වාර්ෂික බදු අයකරණයට පෙර ශුද්ධ හිඟය** | **(133,978,844)** | **(71,184,387)** |
| ආදායම් බදු වියදම | - | (123,701) |
| **වාර්ෂික බදු අයකරණයට පසු ශුද්ධ හිඟය** | **(133,978,844)** | **(71,308,087)** |

## ශේෂ පත්‍රය - 2015 දෙසැම්බර් 31 වන දිනට ශේෂ පත්‍රය

| වත්කම් | 2015.12.31 (රුපියල්) | 2014.12.31 (රුපියල්) |
|---|---|---|
| **ජංගම වත්කම්** | | |
| මුදල් හා මුදල්වලට සමාන දෑ | (28,707,565) | 85,916,015 |
| ණය ගැතියෝ | 43,912,053 | 44,646,521 |
| තොගය | 8,834,824 | 8,969,437 |
| කාර්ය මණ්ඩලයේ දස මාසික ණය ලබාදීම් | 21,369,881 | 19,556,204 |
| අත්තිකාරම් සහ අනෙකුත් ලැබිය යුතු ශේෂ | 91,947,753 | 63,647,064 |
| | **137,356,946** | **222,735,240** |
| **ජංගම නොවන වත්කම්** | | |
| ඉඩම් | 2,856,612,141 | 2,856,612,140 |
| ගොඩනැගිලි | 1,223,818,817 | 1,200,179,737 |
| අධිබලැති විදුලි කුළුණු | 2,048,185 | 2,745,951 |
| අධිබලැති විදුලි බල්බ | 2,766,341 | 572,340 |
| යන්ත්‍ර සහ උපකරණ | 111,092,535 | 130,301,157 |
| පරිගණක යන්ත්‍ර | 4,188,629 | 4,086,262 |
| මෝටර් රථ | 2,141,778 | 5,227,014 |
| ක්‍රීඩා උපකරණ | 32,095,189 | 38,587,037 |
| ලී බඩු සහ උපකරණ | 12,383,983 | 13,670,484 |
| කාර්යාලීය සහ අනෙකුත් උපකරණ | 9,618,343 | 8,370,779 |
| තිර රෙදි | - | 191,266 |
| සිදු කෙරෙමින් පවතින වැඩ | 253,037,812 | 196,215,775 |
| ස්ථාවර තැන්පතු | 29,671,032 | 29,671,032 |
| | **4,539,474,785** | **4,486,430,975** |
| **කෙටිකාලීන ආයෝජන** | | |
| රිපෝ ආයෝජන | 180,000,000 | - |
| | | |
| **සමස්ථ වත්කම්** | **4,856,831,731** | **4,709,166,215** |
| **ප්‍රාග්ධන ස්කන්ධය සහ වගකීම්** | | |
| **වගකීම්** | | |
| **ජංගම වගකීම්** | | |
| වෙළෙඳ ණය හිමියෝ | 5,808,072 | 4,936,741 |
| ආරක්ෂිත තැන්පතු | 10,669,696 | 7,495,173 |
| ලැබූ අත්තිකාරම් මුදල් | 2,925,624 | 4,718,477 |
| බදු ප්‍රතිපාදන | 340,803 | 340,803 |
| එකතුවීම් සහ ගෙවිය යුතු දෑ | 9,181,293 | 17,130,485 |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | 56,280,460 | 50,696,343 |
| | **85,205,946** | **85,318,021** |
| **ජංගම නොවන වගකීම්** | | |
| පාරිතෝෂික වෙන්කිරීම් | 44,215,170 | 40,641,609 |
| බොල් ණය සඳහා වෙන්කිරීම් | 32,898,350 | - |
| **සමස්ථ වගකීම්** | **162,319,466** | **125,959,630** |
| **ශුද්ධ වත්කම්** | **4,694,512,265** | **4,583,206,584** |
| **ශුද්ධ වත්කම්/ ප්‍රාග්ධන ස්කන්ධය** | | |
| රජයේ ප්‍රදාන | 5,985,371,609 | 5,742,371,609 |
| සමුච්චිත අරමුදල | (1,166,215,152) | (1,097,191,589) |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | 9,334,652 | 9,334,652 |
| වර්ෂයේ අතිරික්තය/ ඌනතාවය | (133,978,844) | (71,308,087) |
| **සමස්ථ ශුද්ධ වත්කම්/ ප්‍රාග්ධන ස්කන්ධය** | **4,694,512,265** | **4,583,206,584** |

# අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය

**2015 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | 2015.12.31 (රුපියල්) | 2014.12.31 (රුපියල්) |
|---|---|---|
| **මෙහෙයුම්වලින් ලද මුදල් ප්‍රවාහය** | | |
| **අතිරික්තය/ හිඟය** | **(133,978,844)** | **(71,308,087)** |
| **මූල්‍ය නොවන සංචලන** | | |
| ක්ෂය වෙන්කිරීම් | 89,841,680 | 88,122,823 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | - | - |
| බොල් ණය සඳහා වෙන්කිරීම් | 32,898,350 | - |
| පාරිතෝෂික වෙන්කිරීම් | 4,224,894 | 3,548,586 |
| තොග වැඩිවීම්/අඩුවීම් | 134,613 | 956,952 |
| ලැබිය යුතු ශේෂයන් වැඩිවීම්/අඩුවීම් | (29,379,898) | (17,672,564) |
| ගෙවිය යුතු ශේෂයන් වැඩිවීම්/අඩුවීම් | (112,075) | 28,065,251 |
| පාරිතෝෂික දීමනා ගෙවීම් | (651,332.30) | 1,136,983) |
| **මෙහෙයුම්වලින් ලද ශුද්ධ මුදල් ශේෂය** | **(37,022,614)** | **30,575,977** |
| **ආයෝජන කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහය** | | |
| දේපළ,පිරියත සහ යන්ත්‍ර, උපකරණ මිලදී ගැනීම | (142,885,490) | (137,218,604) |
| බදු ගෙවීම් | - | - |
| ස්ථාවර තැන්පතුවල ආයෝජන | - | (65,501) |
| රිපෝ ආයෝජන | (180,000,000) | - |
| ස්ථාවර තැන්පතුවලින් ලද මුදල් | - | - |
| **ආයෝජන කටයුතුවලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(322,885,490)** | **(137,284,106)** |
| **මූල්‍ය කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහය** | | |
| පෙර වර්ෂයේ ගැලපීම් | 2,284,524 | 125,282 |
| රජයේ ප්‍රාග්ධන ප්‍රදාන | 243,000,000 | 175,000,000 |
| **මූල්‍ය කටයුතුවලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | **245,284,524** | **175,125,281** |
| **මුදල් හා මුදල්වලට සමාන දෑවල ශුද්ධ වැඩිවීම්** | **(114,623,580)** | **68,417,154** |
| **වර්ෂ ආරම්භයේදී මුදල් හා බැංකුගත ශේෂය** | **85,916,015** | **17,498,861** |
| **වර්ෂ අවසානයේදී මුදල් හා බැංකුගත ශේෂය** | **(28,707,565)** | **85,916,015** |

**සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය**

# විගණකාධිපති වාර්තාව

# 2015

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } සීජ්එස්/ඒ/එස්එන්එස්සීඒ/එෆ්ඒ/2015

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2018 මාර්තු 23 දින

සභාපති,

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය.

**සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1999 අංක 17 දරන සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ 9 (2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීත්තර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිති වලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3

ප්‍රමිතයේ 12 වන වගන්තිය පරිදි ගනුදෙනු හා සිද්ධීන් සම්බන්ධව නිශ්චිත රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතයක් නොමැති අවස්ථාවලදී කළමනාකරණය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් නිර්මාණය කර ව්‍යවහාරය කිරීම පිණිස සිය විනිශ්චය උපයෝගී කර ගත යුතු වේ. මීට පටහැනිව වර්ෂ 5 කට අධික කාලයක සිට හිඟ හිටි ආදායම් ශේෂයෙන් සියයට 75 ක් හෙවත් රු. 32,898,350 ක් ප්‍රවර්තන වර්ෂයේදී කපා හැර තිබුණු අතර අදාළ එක් එක් වර්ෂවල ලාභයට ගලපනු වෙනුවට සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයට ගලපා තිබුණි. තවද රු.28,766,675 ක්වූ බැංකු අයිරාව ජංගම වගකීම් යටතේ දක්වනු වෙනුවට මුදල් හා මුදල් සමාන දෑවල ඇතුළත් කර ජංගම වත්කම් වලින් හිලව්කර දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7

(i) ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂික සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. මිලියන 259.8 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 49 වන වගන්තිය ප්‍රකාරව වත්කමක් ප්‍රත්‍යාගණනය කරන්නේ නම් එම වත්කම අයත්වන වත්කම් පන්තිය මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද, අධිකාරිය විසින් යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීමේදී බෝගම්බර, නුවරඑළිය සහ ආර්. ප්‍රේමදාස ක්‍රීඩාංගනය යන ස්ථානවල භාවිතා කරනු ලබන 2015 ජනවාරි 01 වන දිනට පිරිවැය රු.8,307,878 ක් වූ යන්ත්‍ර සූත්‍ර ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

(iii) ප්‍රමිතයේ 69 වන වගන්තිය ප්‍රකාරව වත්කමක් ක්ෂය කිරීම ආරම්භ කළ යුත්තේ එය පාවිච්චිය ආරම්භ කිරීම සඳහා සූදානම් තත්ත්වයට ගෙන ආ පසු වුවද, සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනයේ ඉදි කරන ලද කඩ සාප්පු හා කාර්යාල ගොඩනැගිල්ලේ අත්තිවාරම පමණක් ඉදිකර ඇති අතර ඒ සඳහා වැය කළ රු.16,103,042 ක මුදල 2014 වර්ෂයේදී ප්‍රාග්ධනික කර 2014 සහ 2015 වර්ෂ සඳහා ක්ෂය ලෙස රු.805,152 ක් ප්‍රතිපාදනය කර තිබුණි.

(iv) ප්‍රමිතයේ 90 වන වගන්තිය ප්‍රකාරව රු.9,334,652 ක් වටිනා ප්‍රත්‍යාගණිත යන්ත්‍ර සූත්‍ර හා උපකරණ පිළිබඳව අවශ්‍ය හෙළිදරව් කිරීම සිදුකර නොතිබුණි.

### 2.2.2 අසම්භාව්‍ය බැරකම්

අධිකාරියට අයත් ද්විත්ව කාර්ය වාහනයක් මගින් සිදු වූ මාරක රිය අනතුරක් හේතුවෙන් මිය ගිය දැරියගේ පාර්ශවය විසින් රු. මිලියන 50 ක වන්දියක් ඉල්ලා නුගේගොඩ දිසා අධිකරණයේ පවරන ලද නඩුවක් නිසා පැන නැඟී ඇති අසම්භාව්‍ය බැරකම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණු අතර මෙම අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ආපසු ගෙවනු ලබන තැන්පතු වටිනාකම මූල්‍ය ප්‍රකාශන අනුව රු.10,669,696 ක් වූ අතර විගණනයට ඉදිරිපත් කළ උපලේඛන අනුව එම ශේෂය රු.15,191,048 ක් වූයෙන් රු.4,521,352 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ ගිණුම් අනුව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන් අයවිය යුතු වටිනාකම රු. 21,153,845 ක් වුවද ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ගිණුම් අනුව රු.18,373,845 ක් වූයෙන් රු. 2,780,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

විවිධ ණයගැතියන්ගෙන් අයවිය යුතු ශේෂවල එකතුව රු. 43,912,053 ක් වූ අතර, එම ශේෂ වල ඇතුළත් වර්ෂ 05 කට වැඩි කාලයක් ඉකුත් වූ රු.32,744,245 ක් අය කර ගැනීමට අධිකාරිය විසින් ඵලදායී පියවර ගෙන නොතිබුණි.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගිණුම් විෂයයන්වලට අදාල සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොවිය.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| මෙළද ණයගැතියෝ වෙනත් ණයගැති සහ රඳවුම් මුදල් | 71,696,742 | ශේෂ සනාථ කිරීම් හා විස්තරාත්මක උපලේඛන |
| තොගය | 2,149,491 | තොග ලේඛන හා සමීක්ෂණ වාර්තා |

### 2.2.6 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

විගණනයේදී නිරික්ෂණය වූ නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති රීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1999 අංක 17 දරන සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරි පනතේ 3 (2) ඡේදය | අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය තුළ ක්‍රියාකාරි අධ්‍යක්ෂ තනතුරක් ඇති කර නොතිබූ නමුත්, අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු මාසිකව රු. 60,000 ක් ගෙවීමේ පදනම මත ක්‍රියාකාරි අධ්‍යක්ෂ තනතුරට පත් කර තිබුණි. |

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

| | | |
|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 396 (ඈ) | නිකුත් කළ නමුත් බැංකුව වෙත ඉදිරිපත් නොවූ මාස 6 ඉකුත් වූ එකතුව රු.420,598 ක් වූ චෙක්පත් 22 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමට අධිකාරිය විසින් කාලීනව පියවර ගෙන නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 571 | වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු. 2,386,109 ක් වූ තැන්පතු ආපසු ගෙවීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 754 | මුදල් වර්ෂය අවසානයේදී, බඩු වට්ටෝරු පොත් තුළනය කර නොතිබුණි. |
| (iv) | මුදල් රෙගුලාසි 755(1) | රාජකාරි අත්හැරීමට, මාරුවක් ලැබ යාමට නැතහොත් දීර්ඝ නිවාඩුවක් ලැබ යාමට පෙර, ඔහු විසින් ඔහුගේ අනුප්‍රප්තිකයාට හෝ එම කාර්යය පවරනු ලැබ සිටින වෙන ඕනෑම නිලධාරියෙකුට තම වගකීම යටතේ ඇති සියලුම රජයේ භාණ්ඩ හා වෙනත් දේපළ බාර දී ඒවා බාරගත් නිලධාරියාගෙන් ඒවා ලැබුණු බවට පිටපත් දෙකකින් යුක්ත කුවිතාන්සියක් ලබාගත යුතු වුවද 2016 පෙබරවාරි 02 දින සේවයෙන් විශ්‍රාම ගත් ගබඩා භාරකරු විසින් ඉහත පරිදි ක්‍රියාකර නොතිබුණි. |
| (vi) | මුදල් රෙගුලාසි 756 | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණය සිදුකර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (vii) | මුදල් රෙගුලාසි 758 | සෝදිසි සමීක්ෂණ සිදුකර අනවශ්‍ය තොග හෝ භාවිතා කළ නොහැකි තොග හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (viii) | මුදල් රෙගුලාසි 762 | තොග මට්ටම් නිශ්චය නොකර මිලදී ගැනීම හේතුවෙන් අවශ්‍ය ප්‍රමාණයට වඩා තොග පැවති අතර වසර 1 සිට වසර 13 ක කාලයක් දක්වා නිකුත් නොකළ ලිපිද්‍රව්‍ය, විදුලි උපාංග, ජලනල උපාංග, තීන්ත වර්ග යනාදී එකතු වටිනාකම රු.1,252,847 ක්වූ තොග ශේෂ පැවතුණි. |
| (ඇ) | අංක අයිඒඅයි/1/2002/02 හා 2002 නොවැම්බර් 18 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක හා මෘදුකාංග සඳහා වෙනම ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (ඉ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ | |
| | 5.4.12 මාර්ගෝපදේශය | ගෙවන ලද වැට් බදු පිළිබඳ විස්තර මාසිකව විගණකාධිපති වෙත වාර්තා කර නොතිබුණි. |

8

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.246,797,597 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.71,308,087 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.175,489,510 කින් හෙවත් සියයට 246 කින් පිරිහී තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ ආදායම රු. 34,992,303 කින් අඩුවීම සහ අඩමාණ ණය රු.32,898,350 ක් වෙන් කිරීම ඉහත මූල්‍ය ප්‍රතිඵලය පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමක් සිදු වී තිබුණි. එහෙත් 2013 වර්ෂයට සාපේක්ෂව එම පිරිහීම 2014 වර්ෂයේදී අඩු වී තිබූ අතර නැවතත් සමාලෝචිත වර්ෂයේදී වර්ධනය වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සහ රාජ්‍ය බදු නැවත ගැලපීමේදී 2012 වර්ෂයේදී රු. 90,592,946 ක් වූ අධිකාරියේ අතිරික්තය අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී රු. 799,261 ක් දක්වා පිරිහී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉකුත් වර්ෂයේ 2.61 ක් වූ ජංගම අනුපාතය සමාලෝචිත වර්ෂයේදී 1.60 දක්වා පහත වැටී තිබූ අතර, ක්ෂණික අනුපාතයද 2.5 සිට 1.52 ක් දක්වා පහත වැටී තිබුණි. ඒ අනුව ආයතනයේ කෙටිකාලීන බැරකම් පියවීමේ හැකියාව පහත වැටී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

අධිකාරිය ස්ථාපිත කරන ලද 1999 අංක 17 දරන සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරි පනත අනුව ආයතනයේ අරමුණු මොනවාද යන්න නිශ්චිතව දක්වා නොමැති වුවද, ආයතනයේ කර්තව්‍යයන් ලෙස ජවන හා පිටිය තරඟ, පිහිනුම් තරඟ පැවැත්වීමට හා පුහුණු වැඩමුළු පැවැත්වීම

සඳහා යටිතල පහසුකම් සැපයීම, විභාග සම්මන්ත්‍රණ හා සමුළු පැවැත්වීමට සහ මහජන රසාස්වාදය වෙනුවෙන් ගෘහස්ථ ශාලා පහසුකම් සැපයීම, ක්‍රීඩකයන් සඳහා නේවාසික පහසුකම් සැපයීම සහ එම කාර්යයන් සඳහා පැමිණෙන අයගේ රථවාහන නවතා තැබීමේ පහසුකම් සැපයීම දක්වා තිබුණි.මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියට අයත් හා එමගින් පරිපාලනය කරනු ලබන ක්‍රීඩා හෝටලය 2015 වර්ෂය තුළ නිසි පරිදි දැල් ආවරණ සවිකර නඩත්තු නොකිරීම හේතුවෙන් නේවාසික පිරිස් වලට පරවියන්ගෙන් දැඩි බාධාවන් සිදුවන බව නිරීක්ෂණය විය.

(ආ) 2011 වර්ෂයේදී රු. මිලියන 112 ක් වැයකර ඉදිකරන ලද මීටර් 400 කෘත්‍රිම ධාවන පථය ඉදිකර මාස 2 කින් පසු හානිවීම හේතුවෙන් ජවන හා පිටිය ක්‍රීඩා තරඟ පැවැත්වීමට නොහැකි වී තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පුද්ගලික ආයතනවල ප්‍රචාරණ කටයුතු කිරීම මගින් ආදායම් වැඩිකර ගැනීමේ සහ අධිකාරියේ සේවා අලෙවිය වැඩි කර ගැනීමේ අරමුණෙන් අධිකාරිය විසින් අංක තාක්ෂණ දැන්වීම් (Digital) පුවරු දෙකක් රු. මිලියන 10 ක ඇස්තමේන්තුවක් යටතේ කොළඹ සිරිමාවෝ බණ්ඩාරනායක මාවතට මුහුණලා සුගතදාස එළිමහන් ක්‍රීඩාංගන පරිශ්‍රයේ ඉදි කිරීමට සැලසුම් කර තිබුණි. ඒ අනුව රු. මිලියන 4.9 ක් වැයකර එක් දැන්වීම් පුවරුවක් පමණක් ඉදිකර තිබූ අතර අධිකාරිය විසින් සපයන සේවාවන් පිළිබඳ පුළුල් ප්‍රචාරයක් ලබා දීම මගින් අධිකාරියේ සේවා අලෙවිය වැඩි කර ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් බලාපොරොත්තු වූ අරමුණු ඉටු කර ගැනීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි. තවද, ඇස්තමේන්තු ගත මුදලෙන් රු. මිලියන 5 ක් විධිමත් අනුමැතියකින් තොරව එළිමහන් ක්‍රීඩාංගනයේ පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතියට මාරු කර තිබුණි.

10

(ආ) 2014 වර්ෂයේ ආපන ශාලාව ඉදි කිරීමේ කර්මාන්තය සඳහා වෙන් කරන ලද රු. මිලියන 10 ක් වූ ප්‍රතිපාදන මුදල භාවිතා කරමින් විධිමත් අනුමැතියකින් තොරව ආරක්ෂිත කැමරා පද්ධතියක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතියක් සිදු කර තිබුණ නමුත් එකී ව්‍යාපෘතිය මගින් ස්ථාපිත කළ ආරක්ෂක දර්ශන අපැහැදිලිවීම හා එහි කැමරා පද්ධති නිතර අක්‍රියවීම හේතුවෙන් ව්‍යාපෘතිය අසාර්ථක වී තිබුණි

(ඇ) අධිකාරියට අයත් ක්‍රීඩා හෝටලයේ ආපන ශාලාව ගිවිසුමකින් තොරව ව්‍යාපාරිකයෙකුට මාස 04 ක කාලයක් පවත්වා ගෙන යැමට ඉඩ හැර තිබූ නමුත් ඊට අදාළ බදු මුදල්, විදුලි හා ජල බිල්පත් වෙනුවෙන් අයවිය යුතු රු. 252,929 ක් අයකර ගැනීමට 2018 මාර්තු මාසය වනවිටද කටයුතු කර නොතිබුණි.

**4.3 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්**

අධිකාරියට අයත් කාමර 42 කින් සමන්විත ක්‍රීඩා හෝටලයේ කාමර 03 ක් වර්ෂයක කාලයක් සහ වර්ග අඩි 800 ක බිම හල වර්ෂ 08 ක කාලයක් අභාවිතව පැවතුණි.

**4.4 ආර්ථික නොවූ ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරිය විසින් ගෙවිය යුතුව තිබූ එකතු කළ අගය මත බදු නියමිත දිනට නොගෙවීම හේතුවෙන් රු.3,310,537 ක අධිභාරයක් දේශීය ආදායම් කොමසාරිස් වෙත ගෙවිය යුතුව තිබුණි.

(ආ) ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් තොරව රු. මිලියන 30 ට අඩු කර්මාන්ත ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගම මගින් සිදු කර ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණද, ඊට පටහැනිව රු. මිලියන 63 කට ඇස්තමේන්තු කර තිබූ ක්‍රීඩා හෝටලය නවීකරණ කටයුතු අදියර 03 ක් යටතේ බාණ්ඩ කර ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව තෝරාගත් සමාගමක් වෙත 2015 අප්‍රේල් 08 දින ලබා දී තිබුණි. ගිවිසුම් ප්‍රකාරව මෙම කර්මාන්තය 2015 අගෝස්තු 04 දින නිම කළ යුතු වුවද නිම නොකිරීම නිසා 2018 මාර්තු මාසය වනවිටද නිමකර නොතිබුණි.

(ඈ) වර්ෂ 10 කට ආසන්න කාලයක් අභාවිතව පැවති වර්ග අඩි 990 කින් සමන්විත ආපන ශාලාව මිල ගණන් කැඳවීමකින් තොරව 2015 වර්ෂයේදී රු. 40,000 ක මාසික කුලියට බදු දී තිබූ අතර බදුකරු විසින් තවත් වර්ග අඩි 214 ක් ආපන ශාලාවේ කටයුතු සඳහා මුදල් ගෙවීමකින් තොරව පරිහරණය කර තිබුණි.

### 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

අධිකාරිය විසින් පාරක්ෂක සේවයට බඳවා ගෙන තිබූ නිලධාරීන් 27 දෙනෙකු එම සේවයේ නොයොදවා මුදල් අයකැමි, අභ්‍යන්තර විගණනය වැනි රාජකාරිවල යොදවා තිබුණි.

### 4.6 වාහන උපයෝජනය

ක්‍රීඩා අමාත්‍යාංශයට අයත් කැබ් රථයක් විධිමත් ලෙස අධිකාරිය වෙත පවරා ගැනීමකින් තොරව අධිකාරිය විසින් රක්ෂණය කර තිබූ අතර එම කැබ් රථය අලුත්වැඩියා නොකිරීම හේතුවෙන් භාවිතයෙන් ඉවත් කර තිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) වත්කම් කළමනාකරණය | (i) වත්කම්වල අගය නිවැරදි ලෙස ප්‍රාග්ධනීත නොකිරීම. |
| | (ii) ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොගැනීම . |

12

| | | | |
|---|---|---|---|
| | | (iii) | සම්පූර්ණ ක්ෂය කරන ලද නමුත් භාවිතයට ගනු ලබන වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත නොකිරීම. |
| (ආ) | ගිණුම්කරණය | | ගිණුම්කරණය සඳහා මිලදී ගත් මෘදුකාංගය මගින් සම්පූර්ණ ගිණුම් පද්ධතිය ක්‍රියාත්මක නොකිරීම. |
| (ඇ) | ණයගැති පාලනය | (i) | උපරිම ණයගැති සීමාව හා කාලය සම්බන්ධයෙන් සීමා නිර්ණය නොකිරීම. |
| | | (ii) | ණයගැතියන්ගේ ශේෂ සනාථන ලබා නොගැනීම. |
| (ඇ) | මානව සම්පත් කළමනාකරණය | | ඇඟිලි සලකුණු යන්ත්‍ර නිසි පරිදි ක්‍රියාත්මක නොකිරීම. |
| (ඉ) | කොන්ත්‍රාත් පරිපාලනය | | අවශ්‍යතා නිසි පරිදි හඳුනා ගැනීම, ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුගමනය කිරීම, නිවැරදි ඇස්තමේන්තු සකස් කිරීම, නිසි අධීක්ෂණයක් සිදුකිරීම, ප්‍රමාද ගාස්තු අය කිරීම යන මූලික කරුණු සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු නොකිරීම. |

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

**සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

**යාවත්කාලීන කරන ලද තොරතුරු**

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති.**

(අ) 2017/12/31 දිනට නිවැරදි කර ඇත.

(ඇ) (i) නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී.
(ii) නිවැරදිව ප්‍රත්‍යාගණනය සිදුකර පොත්වලට ගැනීමට කටයුතු කරමින් පවතී.
(iii) 2017/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිවැරදි කර ඇත.
(iv) 2017/12/31 දිනට නිවැරදි කර ඇත.

**2.2.2 අසම්භාව්‍ය බැරකම්.**

2017/12/31 දිනට හෙළිදරව් කිරීම් සිදුකර ඇත.

**2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්.**

(අ) වෙනසට හේතු සොයා නිවැරැදි කිරීම් සිදුකර ඇත.

(ආ) වෙනසට හේතු සොයා නිවැරැදි කිරීම් සිදුකර මුදල් අයකර ගැනීමට සිදුකර ඇත. 2016/12/31 දින වනවිට රු.මි.18,753,844.63 සිට රු.මි.16,953,844.63 දක්වා අඩු වී ඇත.

**2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්.**

2015/12/31 දින වනවිට පැවැති රු.මි.43,912,053.00 න් 2017/06/30 දින වනවිට රු. 4,652,171.32 ක් අයකරගෙන ඇත.

**2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම.**

2016/12/31 දිනට නිවැරදි කර ඇත.

**2.2.6 නීතිරීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

(අ) 1999 අංක 17 දරණ සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරි පනතට අනුව අධිකාරියේ කර්තව්‍යන් ඉටුකිරීම සඳහා අවශ්‍ය වන නිළධාරීන් පත් කිරීමේ බලයට අනුව කළමනාකාරිත්ව මණ්ඩලයේ එක් සාමාජිකයෙකුට ව්‍යාපෘති හා සම්බන්ධීකරණ කාර්යන් ඉටු කිරීම සඳහා තාවකාලිකව පත්කර ගන්නා ලදි. පසුව කළමනාකාරීත්ව මණ්ඩලයේ උපදෙස් අනුව අධිකාරී පනත සංශෝධනය කර 2017 අංක 14 දරණ (සංශෝධන) පනතට අනුව ක්‍රියාකාරී අධ්‍යක්ෂ ධූරයට කළමනාකාරිත්ව මණ්ඩලයේ සාමාජිකයෙකු පත් කිරීමට පනත මගින් බලය පවරා ඇත.

(ආ) (i) 2016/12/31 දින වන වට නිවැරදි කර ඇත.
(ii) මේ වනවිට නිවැරදි කර ඇත.
(iii) මේ වනවිට නිවැරදි කර ඇත.
(iv) එසේ සිදුවීම් මේ වනවිට වළක්වා ඇත.
(vi) මේ වනවිට නිවැරදි කර ඇත.
(vii) මේ වනවිට නිවැරදි කර ඇත.

(viii) භාවිතා කළ නොහැකි තොග අවශ්‍යතා හඳුනාගෙන ප්‍රයෝජනයට ගෙන ඇති අතර, වර්තමානයේ භාණ්ඩ තොග රැස්තර තබා ගැනීම සිදුකරනු නොලැබේ.

(ඇ) නිවැරදි කර ඇත.

(ඉ) නිවැරදි කර ඇත.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

නිවැරදි කර ගැනීමට හා ආදායම් වර්ධනය කර ගැනීමට කටයුතු කරමින් පවතී.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ජංගම වගකීම් අනුපාතය 2:1 සහ ක්ෂණික වත්කම් අනුපාතයද මධ්‍යස්ථව පවත්වාගෙන යාමට කටයුතු කරමින් පවතී.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

(අ) ක්‍රීඩා හෝටලය ප්‍රතිසංස්කරණය කිරීමෙන් පසු නිවැරදි කර ඇත
(ආ) නීතිමය ක්‍රියාමාර්ග සඳහා යොමුකර ඇත

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

(අ) සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනයේ සවිකර තිබෙන උක්ත ඩිජිටල් දැන්වීම් පුවරුව මඟින් ආයතනය විසින් සපයනු ලබන පහසුකම් පිළිබඳව ප්‍රචාරක කටයුතු සිදුවන අතර, රාජ්‍ය සහ පෞද්ගලික ආයතන මඟින් සපයනු ලබන දැන්වීම් ප්‍රචාරණය හරහා අධිකාරියට ආදායම් උත්පාදනය සිදු වේ.

අධිකාරියේ අධ්‍යක්ෂතුමන් විසින් කළමනාකරු මිළදී ගැනීම් වෙත යොමුකරන ලද 2016/01/13 දින ලිපියට අනුව ඩිජිටල් දැන්වීම් පුවරු සඳහා වෙන්කළ මුදලින් රු.මිලියන 05ක මුදලක් පරිපාලන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු සඳහා යොදවා ඇත.

(ආ) ආපන ශාලාව ඉදිකිරීමේ ව්‍යාපෘතිය

(ඇ) 2015 වසරේ මෙම බදුකරුට කළමනාකාරීත්ව මණ්ඩල අනුමැතියට අනුව ක්‍රීඩා හෝටලයේ ආපන ශාලාව ලබාදී ඇත. ගෙවිය යුතු හිඟ මුදල් අධිකාරියට ගෙවීමට දන්වා ඇත. මෙතෙක් ගෙවා නොමැති බැවින් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නියමිත වේ.

### 4.3 නිශ්ක්‍රිය හා ඌණ උපයෝජිත වත්කම්

මෙම ක්‍රීඩා හෝටලය නවීකරණය කිරීමේ තත්ත්වයේ පැවතුණි. බීමහල සඳහා බලපත්‍ර ලබා ගැනීමේ අවශ්‍යතාවයක් තිබී නැත. මේ වන විට ක්‍රීඩා හෝටලය නවීකරණය කර ඇත.

### 4.4 ආර්ථික නොවූ ගනුදෙනු

(අ) මෙය නිවැරදි කරන ලද අතර දේශිය ආදායම් දෙපාර්තමේන්තුව විසින් යාවත්කාලින තොරතුරු ලිඛිතව දන්වන බව ප්‍රකාශ කර ඇත.

(ආ) දින 100 වැඩ සටහන යටතේ ක්‍රියාත්මකවූ මෙම ව්‍යාපෘතියේ වැඩකටයුතු මේ වනවිට අවසන් කර ඇත.

(ඇ) කළමනාකාරීත්ව මණ්ඩල අනුමැතිය යටතේ පරිහරණය සඳහා කුලියට ලබාදී ඇත. මේ වනවිට ක්‍රීඩා හෝටලය මුලුමනින්ම නවීකරණය කර ඇත.

**4.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

මෙම අධිකාරියේ පවතින සේවා අවශ්‍යතාවය මත ආරක්ෂක නිළධාරීන් අනුයුක්ත කර ඇත. මේ සඳහා යෝජිත කාර්ය මණ්ඩල තොරතුරු සකසා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව වැටුප් කොමිෂන් සභාව 2018 වසරේ පෙබරවාරි මස සාකච්ඡාවක් පවත්වන ලදි. මෙම අනියුක්ත තනතුරු සඳහා ඔවුන්ට පුද්ගලික වන සේ සේවයේ යොදවා ඇති සේවකයින් යොදවා ඇති තනතුරු වලට පත් කිරීමට ක්‍රියා කිරීමට එකග වන ලදි.

**4.6 වාහන උපයෝජනය**

මෙම අධිකාරියේ ඇති 252-7017 අංක දරණ කැබ් රථය මෝටර් රථ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි අංක CRLOTES0004527 යටතේ ලියාපදිංචි කර පවරාගෙන ඇත. මේ වන විට පරිහරණය කළ හැකි ආකාරයට අලුත්වැඩියා කර භාවිතයේ යොදවා ඇත.

**5. පද්ධති හා පාලනයන්**

(අ) (1) නිවැරදි කිරීමට කටයුතු යොදා ඇත.
(2) නිවැරදි කර ඇත.
(3) නිවැරදි කිරීමට කටයුතු සිදු කරමින් පවතී.

(ආ) නිවැරදි කිරීමට කටයුතු යොදා ඇත.

(ඇ) (1) , (2) නිවැරදි කිරීමට කටයුතු යොදා ඇත.

(ඉ) මේ වන විට නිසි ආකාරයට උපදේශන ආයතනයන්ගේ මගපෙන්වීම යටතේ ඉටුකරගෙන යනු ලබයි.

**සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය**
**තැ.පෙ. 2211 ආතර් ද සිල්වා මාවත,**
**කොළඹ 13**

**ගෘහස්ථ ක්‍රීඩාංගනය :** 0112 445 677, 2 422 841, 2 384 490, 2 384 385
**එළිමහන් ක්‍රීඩාංගනය :** 0112 423 333
**ෆැක්ස් :** 0112 445 675
**ඊමේල් :** chairmansnsca@yahoo.com, sugathadasaindoor@gmail.com

**බෝගම්බර ක්‍රීඩාංගනය:** 0812 235 395
**නුවරඑළිය තුරඟ තරඟ පිටිය:** 0522 222 659
**බෙලිඅත්ත පිහිණුම් තටාකය:** 0472 251 685